# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,886 — 1969 දෙසැම්බර් 26 වැනි සිකුරාදා — 1969.12.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 2041 | කොටුපල් ටෙන්ඩ හා වෙනත් ටෙන්ඩ විකිණීම ... ... | 2078 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2052 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 2066 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 2077 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | 2078 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 2077 | විවිධ දැන්වීම ... ... ... | — |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම් පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්බාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. සඳහන් නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. සී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ආ) (i) ප්‍රවාහණය විශේෂ විෂයය ලෙස ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක්

හෝ

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ විද්‍යා ඩිප්ලෝමා සහතික පත්‍රය සහ ප්‍රවාහණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව විභාගයේ කොටසකින් සාමාර්ථය ලබා තිබීම.

(ඇ) ගාල්ල, කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම් කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකිය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකාත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

**සැලක්‍ෂ්‍යය :**

(1) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්ම සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

12–1115/1—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 94/එක්ස්. 2175/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල II වෙනි ශ්‍රෙණියේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ කථිකාචාර්ය තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල ශාරීරික අධ්‍යාපනය පිළිබඳ II වැනි ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි :—

(1) මෙරට අයදුම්පත් : 1970 ජනවාරි මස 16 වැනිදා.
(2) පිටරට අයදුම්පත් : 1970 ජනවාරි මස 23 වැනිදා.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි තැන් තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයා ගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණ හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ලංකාවට පැමිණීම සඳහා ඔවුන් ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතුවෙයි.

2. **වැටුප්, දීමනා හා සේවා කොන්දේසි.—**

(1) මෙම තනතුර සඳහා රු. 6,720—12×360—රු. 11,040 වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමයක් නියමිතය.

(2) තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය. දැනට ඇබෑර්තු ඇත්තේ කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් මේ විශ්ව විද්‍යාලයට පත් කරනු ලැබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.—**

(1) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම ප්‍රථමකොට අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.—**සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1970. 1. 16 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරන අයගේ අයදුම්පත් උපරිම වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.)

(ආ) I. පිළිගත් විශ්ව විද්‍යාලයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධියක්

හෝ

අවුරුදු දෙකක හෝ තුනක පූර්ණකාල අධ්‍යයනයකින් පසු ලබාගත් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපන ඩිප්ලෝමා සහතික පත්‍රයක්

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ, පිළිගත් විද්‍යාලයයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපන ගුරු සහතික පත්‍රයක්

සහ

II. ශාරීරික අධ්‍යාපන වැඩ පරිපාලනය පිළිබඳව හෝ ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳව අවුරුදු තුනක පළපුරුද්දක් ලබා තිබීම.

(ඇ) කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලයේ තනතුරු සඳහා අයදුම් කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමට මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළදී සිංහල හෝ දෙමළ (අදාල විය හැකි පරිදි) පිළිබඳ නියමිත තත්ත්වයක වැඩිපුර ප්‍රවීණතාවයක් ලබා ගන්නා ලෙස පත්වීම සඳහා තෝරා ගන්නා ලද ඕනෑම තැනැත්තෙකුගෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ට ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සනීපයෙන් යුක්තවීම.

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවකදී අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(ආ) උපාධිය සහ උසස් ම අධ්‍යාපන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්, මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන්, විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(ඉ) සිංහලෙන් සමත් වූ උසස් ම විභාගයේ සහතික පත්‍රය.

සංලක්ෂ්‍යය :

(1) අයදුම් පත්‍රයට ලියවිලි පිටපත් නො ඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවා නියුක්ත නිලධාරින් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්ම සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට නො එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට, ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණ බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූ ද ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 දෙසැම්බර් මස 18 වැනි දින,
තැ. පෙ. 500.
කොළඹ 1, ගාළු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

12–1115/2—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/30/144 (ජී)

## ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා සාමාන්‍ය ලිපිකරු සේවයේ ලිපිකරුවන්

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩුවලට පත්කිරීම සඳහා (අ) සිංහල හා ඉංග්‍රීසි හෝ (අ.) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි හෝ ප්‍රවීනත්වය ඇති සාමාන්‍ය ලිපිකරු සේවයේ (වි. ලි. ප. II හා සා. ලි. ප.) නිලධාරීන්ගෙන් ඉල්ලුම්පත් භාර ගනු ලැබේ. එම, සුදුසු නිලධාරීන්, සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් මත යැපීම් දීමනාවන් හා ගමන් වියදම් දීමනාවන් ද නිරවුල් කිරීමේ නිලධාරිගේ සහතිකය මත ගෙවිය හැකි මසකට රු. 30 ක රාජකාරි දීමනාවක් ද ගෙවනු ලබන කථා පරිවර්තකයන් ලෙස චාරිකා රාජකාරි සඳහා තෝරා ගනු ලැබීමට ද ඉඩ ඇත.

2. අපේක්ෂකයන්, ඉහත (අ) හෝ (ආ) හෝ යටතේ සඳහන් භාෂාවන් විෂයයන් වශයෙන් ඇතිව අඩු වශයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ පොදු අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ සහිත විය යුතුය. මේ නිවේදනයේ කාර්යයන් සඳහා භාණ්ඩාගාරය විසින් පවත්වනු ලබන ප්‍රවීණතා පරීක්ෂණයෙහි සිංහල/දෙමළ උසස් පෙළ සාමාර්ථයක් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ පොදු අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ පරීක්ෂණයෙහි සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ.

3. තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂාවෙන් මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන්ද රාජකාරී කිරීමට කැමති විය යුතුය. සහකාර නිරවුල් කිරීමේ නිලධාරීන් කැටුව චාරිකාවල යෑමටත්, කතා පරිවර්තනය හා භාෂා පරිවර්තනය කටයුතුවල යෙදීමටත් ඔවුන් කැමති විය යුතුය.

4. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය ප්‍රකාර ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවෙහි, නිරවුල් කිරීමේ නිලධාරි වෙත 1970 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන ලෙස ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී, අපේක්ෂකයා තෝරා ගන්නා ලද නම් ඔහු හැකිතාක් ඉක්මනින් මුදා හරිනු ලැබිය හැකි දිනයද ප්‍රතියෝජනයක් අවශ්‍ය වේද යන බවද දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය.

5. අවශ්‍ය වුවහොත්, කොළඹදී, සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමටද අපේක්ෂකයන්ට සිදුවිය හැකිය. එවැනි සම්මුඛ පරීක්ෂණයකදී ඔවුන්ගේ අධ්‍යාපනික සහතික ඉදිරිපත් කිරීම ද අවශ්‍ය විය හැකිය. මේ කාර්යය සඳහා ගමන් වියදම් හා රාජකාරි නිවාඩු ලබා ගැනීමට ඉඩ දෙනු ඇත.

6. ඉහත සඳහන් කොන්දේසි හැරුණු විට, තෝරා ගනු ලබන අයදුම් කරුවන්, ඔවුන්ට මෙතෙක් නිකුත් කර ඇති පත්වීමේ ලිපිවල සඳහන් වගන්ති හා කොන්දේසිවලින්ද බැඳී සිටිනු ඇත.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්,

1969 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදීය.

### ආදර්ශ අයදුම්පත් ආකෘතිය

### ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අයදුම්පත

1. සම්පූර්ණ නම : (වාසගම මුලට) (පැහැදිලි අකුරින්) :————.
2. උපන් දිනය :————.
3. පන්තිය හෝ ශ්‍රේණිය සහ ඊට ඇතුළත් වූ දිනය :————.
4. ඔබ සාමාන්‍ය ලිපිකරු සේවයට බඳවා ගන්නා ලද්දේ කුනම භාෂා මාධ්‍යයකින් ද ? :————.
5. දැනට නියුක්ත දෙපාර්තමේන්තුව හා කාර්ය ස්ථානය :————.
6. කාර්යාලයීය ලිපිනය :————.
7. සමත් වී ඇති උසස්ම විභාගය :————.
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
   (සම්මාන සාමාර්ථයන් සඳහන් කරන්න)

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මේ අයදුම්කරු සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු/සාමාන්‍ය ලිපිකරු පන්තියේ නිලධාරියෙකු බව මම සහතික කරමි. 1970 වේ ......................මස ......................වැනි දින සිට ඔහු නිදහස් කළ හැක/ඔහු නිදහස් කළ නොහැක. ඔහු වෙනුවට අනුප්‍රාප්තිකයෙකු අවශ්‍යයය./අනවශ්‍යයය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

12–1094—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ඉංජිනේරු අංශයේ I වැනි ශ්‍රේණියේ පෝර්මන් තනතුරු

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ I වැනි ශ්‍රේණියේ පෝර්මන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වන සේ පිළියෙල කරන ලද අයදුම්පත් 1970 ජනවාරි මස 20 දිනට හෝ ඊට පෙර, පේරාදෙණියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. **වේතනය.**—මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය : අවුරුද්දකට රු. 2,820—9×120 සහ 8×180 රුපියල් 5,340 වේ.

(ඒකාබද්ධ වැටුප් වර්ෂයකට රු. 5,304—9×144 සහ 8×180—රු. 8,040.)

(තෝරාගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඔවුන්ට වේතන පරිමාණයේ වැටුප් වැඩි කිරීමෙන් සහනයක් දීමට සැහේ නම් භාණ්ඩාගාරයේ උපදෙස් අනුව එසේ කරනු ලැබේ.)

3. **සේවයේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ප්‍රථම වශයෙන් තනතුරට පත් කරන්නේ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත් කොටය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම ඔහුට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි තිබිය යුතුය :—

(i) ජ්‍යෙෂ්ඨ විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් හෝ සමත්වීම හා පූරුදුවීමේ සේවා කාලය හැරුණු විට, වැඩපළක අට අවුරුදු පුහුණුවක් තිබීම නැතහොත් කණිෂ්ඨ විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් සමත් වී සිටීම හා පුහුණුවීමේ සේවා කාලයත් ඇතුළුව වැඩපළක අවුරුදු 15 ක පුහුණුවක් තිබීම. මෙයින් අවුරුදු 8 කට නොඅඩු කාලයක් පිළිගත් වැඩපළක හෝ රජයේ කාර්මික දෙපාර්තමේන්තුවක පරිපාලනමය වශයෙන් සේවයක් තිබිය යුතුය.

(ii) 1970 ජනවාරි 20 දිනට අවුරුදු 45 නොවැඩි වයසක් තිබීම.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්වලට පහත සඳහන් සහතිකයන්ගේ පිටපත් ඇමිණිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපනය සම්බන්ධයෙන් ලබා ඇති උසස්ම සහතිකය.

(iii) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධයෙන් ඇති සහතික.

(iv) චරිතය සම්බන්ධයෙන් නොබෝදා ලබාගත් සහතික තුනක්.

6. අයදුම්පත් මගේ පුද්ගලික නමට හෝ මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරියෙකුගේ නමට නොඑවිය යුතුයි.

7 මෙම ගැසට් පත්‍රයේ I වැනි භාගයේ II වැනි ඡේදයෙහි මුලින්ම දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාලවන සාමාන්‍ය කොන්දේසිද බලන්න.

ඇම්. ඇස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් 17 දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

### I වැනි ශ්‍රේණියේ පෝර්මන් තනතුර සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. 1970 ජනවාරි 20 දිනට වයස සහ උපන් දිනය :————.
4. උපන් ස්ථානය :————.
   (අ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
5. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙක් ද ? :————.
      (i) උත්පත්තියෙන් ද :————.
      (ii) නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද ? :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
7. කාර්මික සුදුසුකම් :————.
8. පළපුරුද්ද :————.
9. වෙනත් සුදුසුකම් :————.
10. චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කරන්නාවූ තිදෙනාගේ නම් :—
   (1) ————.
   (2) ————.
   (3) ————.

මෙම අයදුම්පත්‍රයෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය ඒවා බවට සහතික කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වේනාවා පමණක් නොව පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හේතුවන බවද මම හොඳහැටි දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–1111—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## මහා මාර්ග දෙපාර්තමේන්තුව

### III වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර

මහා මාර්ග දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව මෙම ඉල්ලුම්පත්‍ර පිළියෙල කර 1970.1.26 දින හෝ ඊට පෙර කොළඹ, මහා මාර්ග අධ්‍යක්ෂ 'ආයතන ශාඛාව' වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප.**—වර්ෂයකට රු. 4,152 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 144 ක වාර්ෂික වැටුප් වැඩිවීම්වලින් යුතුව රු. 5,016 දක්වා වැඩිවන වැටුප් ක්‍රමයක් මෙම තනතුර සඳහා නියමව ඇත.

3. **වයස.**—අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර 27 ට වැඩි නොවිය යුතුය. දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල පවත්වන්නේ නැත.

4. **සේවයට බැඳීමේ කොන්දේසි :**

(i) තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) ඇතුළත් දී කෙටි කාලයක් ඇතුළත පත්වීම් භාර ගැනීමට නියම කරනු ලැබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් වලින් එකක් තිබිය යුතුය :—

(අ) රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ විදුලි ෆෝමන් ආධුනික පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර III ශ්‍රේණියේ ෆෝමන්වරුන් සඳහා ඇති පළමුවැනි දෙපාර්තමේන්තු විභාගයෙන් සමත් වී සිටිය යුතුය. නැතහොත් ඊට සමාන හෝ උසස් සුදුසුකම් ලබා සිටිය යුතුය.

(ආ) කටුබැද්දේ කාර්මික ප්‍රායෝගික විද්‍යායතනය මගින් පවත්වන කණිෂ්ඨ කාර්මික නිලධාරි (විදුලි) සඳහා වූ විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සමත් වී සිටිය යුතු අතර ඊට අමතරව යටත් පිරිසෙයින් අවුරුදු තුනක් පිළිගත හැකි ආයතනයක මේ සඳහා පළපුරුද්දක් තිබිය යුතුය.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාඨශාලාවල ප්‍රයෝජනය සඳහා නිකුත් කරන සහතිකය භාරගනු නොලැබේ.)

(ii) තමා සතුව ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) කාර්මික සුදුසුකම් සනාථ කරන සහතික.

(iv) මුලින් දැරූ පත්වීම් සහ පළපුරුද්ද පිළිබඳ සහතික.

(v) චරිතය පිළිබඳ මෑතදී ලබා ඇති සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් විසින් මේ උප වගන්තිය යටතේ ඉල්වා ඇති සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

7. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එවැනි ඉල්ලුම්පත්‍ර නියමිත දිනයට පසුව මේ කාර්යාලයට ලැබුණ හොත් භාර නොගන්නවා ඇත. එහෙත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඒවා කල් ඇතිව ලැබී එසේ ප්‍රමාදවීමට හේතු වූ කරුණු සඳහන් කර ඒවා භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ කර සිටිතොත් භාරගනු ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධව සහ ඊට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. මෙයට සම්බන්ධව ඇති ඉල්ලුම්පත්‍ර හෝ වෙනත් ලියවිලි හෝ ඉහත 1 වන ඡේදයේ සඳහන් ලිපිනයට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිදු නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයකට නොඑවිය යුතුය.

එන්. ජී. වික්‍රමසිංහ,
මහා මාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

මහා මාර්ග දෙපාර්තමේන්තුව,
පහළ චැතැම් වීදිය,
69.12.18 දින, කොළඹ 1.

### ආදර්ශ අයදුම් පත්‍රය

**මහා මාර්ග දෙපාර්තමේන්තුවේ III වැනි ශ්‍රේණියේ විදුලි ෆෝමන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. (i) නම (මුලකුරු සමග) :————.
(ii) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. (i) උපන් දිනය සහ ස්ථානය :————.
(ii) 1970.1.26 දිනට වයස :—අවුරුදු :——, මාස :——.

4. (i) ජාතිය :————.
(ii) ලාංකික වන්නේ, උත්පත්තියෙන්ද ලියාපදිංචි කිරීමෙන් ද ? :————.

5. උපන් ස්ථානය :—
(i) අයදුම්කරුගේ පියාගේ :————.
(ii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(iii) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

6. දැනට යම් තනතුරක් දරන්නේ නම් :—
(i) තනතුර :————.
(ii) දෙපාර්තමේන්තුව :————.
(iii) වැටුප් විස්තරය :————.

7. අධ්‍යාපන සුදුසුකම් (සමත් කළ විභාග සඳහන් කරන්න) : ————.

8. කාර්මික සුදුසුකම් (සමත් කළ විභාග සඳහන් කරන්න) : ————.

9. පළපුරුද්ද ගැන විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුණු විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව සොයා ගනු ලැබුවහොත්, තේරීමට කලින් මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–1109—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/3/ශිෂ්‍ය/503.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970-71 බෙල්ජියානු රජයේ ශිෂ්‍යත්ව

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු උපාධිය දක්වා අධ්‍යයනය සඳහා බෙල්ජියානු රජය විසින් 1970 සැප්තැම්බර් මාසයේ සිට පිරිනමන ශිෂ්‍යත්වයක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් අයගෙන් අයදුම් පත් භාරගනු නොලැබේ :—

(අ) ස්ථිර තනතුරු දරණ හා තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින රජයේ සේවකයින්.

(ආ) ස්ථිර තනතුරු දරණ හා තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්.

(ඉ) දැනටමත් ලංකාවේ හෝ විදේශීය විශ්ව විද්‍යාලයක කිසියම් පාඨ මාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි, මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන්, බෙල්ජියානු භාෂාව පිළිබඳ එක් අවුරුදු පූර්ව පාඨ මාලාවකට පසු අවුරුදු 4-5 දක්වා වන්නේය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ බෙල්ජියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට සූථවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1970.9.15 වැනි දිනට, වයස අවුරුදු 22 ට අඩු විය යුතුයි.

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීනත්වයක් තිබිය යුතුය.

(iv) පහත සඳහන් විෂයයන් තුනෙන් යටත් පිරිසෙයින් එක කටවත් සම්මාන සාමාර්ථයක් සහිතව, එකමවතාවකදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සමත් වී සිටිය යුතුයි :—

(අ) රසායන විද්‍යාව.

(ආ) භෞතික විද්‍යාව සහ

(ඉ) ගණිතය (ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය)

(තෝරාගනු ලබන අපේක්ෂකයා හෝ අපේක්ෂිකාව විසින් තම විශෙෂ විෂය ආරම්භ කිරීමට පෙර බල්ගේරියානු භාෂාව පිළිබඳ එක් අවුරුදු පාඨමාලාවක් අනුගමනය කළ යුතුවේ.)

**සංලක්ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.9.15 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස් වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නෝ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

**4. ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

1. ඉතාම කෙටි මාර්ගයෙන් බල්ගේරියාවට යාම සඳහා ආර්ථික පංතියේ ගුවන් ගමන් ගාස්තුව හා සාර්ථක ලෙස පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු ගමන් ගාස්තුව.

2. මසකට ලෙව්ස් 80 බැගින් වූ යැපීම් දීමනාවක්.

3. නොමිලේ ඉගැන්වීම හා නොමිලේ වෛද්‍ය පහසුකම්.

4. ශිෂ්‍ය නිවාසයේ නොමිලේ නැවතීමේ පහසුකම්.

(විවාහක ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පවුල් සඳහා නිවාස පහසුකම් සලසාදෙනු නොලැබේ.)

**5. සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

**6. ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් බල්ගේරියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුව හොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

**7. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් බල්ගේරියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබා දීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාමයෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970.1.11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අසිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 දෙසැම්බර් මස 17 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

12–1105—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි තනතුරු (විද්‍යා)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (විද්‍යා) තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම අයදුම් කරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළයුතු ඉල්ලුම් පත්‍ර, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත 1970.1.20 වැනි දිනට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය.

**සංලක්ෂය.**—(i) මෙම තනතුරු ඉල්ලුම් කිරීමට කැමති අය, ගුරුවරයකු වශයෙන් ලියපදිංචි කළ අංකය ලබාගෙන ඇති උපාධිය විෂයයන් හා ඉගැන්වීමේ පළපුරුද්ද යනාදිය සඳහන් කරමින් මුද්‍රිත ආකෘති පත්‍රයක් ලබා ගැනීම සඳහා කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත ඉල්ලුම් කළ යුතුය. 1970. 1. 16 වැනි දින තෙක් එම ආකෘති පත්‍ර ලබාගත හැක. අංක : සාප/25/18 යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. තමාගේ ලිපිනය ලියන ලද මුද්දර රහිත දිග ලියුම් කවරයක් ද එවිය යුතුය. පෞද්ගලිකව පැමිණෙන්නන්ට මුද්‍රිත ආකෘති පත්‍ර දෙනු නො ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

**2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(i) මෙම තනතුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වෙත්. ස්ත්‍රියක් මෙම තනතුරට පත් කරන ලද නම් ඇයට අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයක් හිමිවන අතර ඇය විසින් ස්වකීය වැටුපෙන් සියයට පහක් (5 %) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරුවෝ දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි යෙදී නොසිටිත් නම් අවස්ථාවෝචිත පරිදි අවුරුදු තුනක් ආධුනික හෝ පරීක්ෂා කාලයකට යටත්ව පත් කරනු ලබනවා ඇත. අවුරුදු 10ක් සේවය සම්පූර්ණ කිරීමට මත තෙත් අර්ථසාධක අරමුදලට තවදුරටත් දායකවීමේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීමේ හෝ තීරණය සිය මනාපය පරිදි ගැහැණු නිලධාරිනියක විසින් කළ යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබිය හැකි ගුරුවරියක ලෙස හා/හෝ අර්ථසාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනට අවුරුදු 10 ක් සේවය කර ඇත් නම් මෙම පත්වීම ලැබී මාස 6 ක් ඇතුළත ඇගේ මනාපය පරිදි තීරණය කළ යුතුයි.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පත්වීම ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත දී, රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා හා පාලන රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද යන ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ විභාගයකින් සාමාර්ථය ලැබිය යුතුයි. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතු වේ. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩදී ඇති කාලසීමාවට වැඩිපුර කාලයක් ගතවී එයින් සාමාර්ථය ලැබූ විට වැඩිපුර ගතවූ කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලැබේ.

(iii) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දෙවෙනි කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීම සඳහා විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ හා අනිකුත් නිලධාරීන්ට නියමිත ජාතික භාෂා පිළිබඳ විභාගයේදී (දෙමළ නිලධාරීන් නම්) සිංහලෙන් ද, (සිංහල නිලධාරීන් නම්) දෙමළෙන් ද, සාමාර්ථය ලබාගත යුතුය. දෙවැනි කාර්යක්ෂමතා කඩඉමෙන් ඉක්මගොස් සිටින අය තෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීම සඳහා එම විභාගයෙන් සාමාර්ථය ලබා ගැනීමට අවශ්‍ය වනු ඇත. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතු වේ. ඉඩදී ඇති කාලසීමාවට වඩා ගතවන වැඩිපුර කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලබනවා ඇත.

(iv) නිලධාරියෙකු තවදුරටත් සේවයේ රඳවා ගැනීම නුසුදුසු යයි වැටහී ගියහොත් ආධුනික/පරීක්ෂණ කාලය ඇතුළත කවර අවස්ථාවකදී හෝ එය අවසානයේදී හෝ ඔහුගේ/ඇයගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ තිබේ.

(v) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් ඔවුන්ට නියම කරනු ලැබෙන ලංකාවේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම අවශ්‍ය වනු ඇත.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය මෙසේය : රු. 6,024 වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 4 කින් ද, රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් සහ රු. 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද, වාර්ෂික වැටුප රු. 6,780, රු. 7,500 හා රු. 8,280 යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප් රු. 9,480 දක්වා නගිනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඈ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) 1970. 1. 20 වැනි දිනට වයස අවුරුදු 23 ට නොඅඩු බවට හා අවුරුදු 40ට නොවැඩි බවට (මෙම වයස් සීමාව රජයේ සේවයේ නියුක්ත වූවන්ට හා අධ්‍යක්ෂ පාලිත පාඨශාලාවල ගුරුවරුන්ට අදාළ නොවේ.)

(බී) උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් උපාධියට ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු බවට.

(සී) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ වෙනත් උසස් විභාගයකදී, සිංහල භාෂාවෙන් හෝ සිංහල සාහිත්‍යයෙන්/දෙමළ භාෂාවෙන් හෝ දෙමළ සාහිත්‍යයෙන් හෝ සාමාර්ථය ලබා ඇති බවට.

(ඩී) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

**සංලක්ෂ්‍යය.**—ඉගැන්වීමේ පළපුරුද්ද වැඩිමනත් සුදුසුකමක් වනු ඇත.

5. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය පිළිගනු නොලැබේ.)

(ii) ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ඇත් නම් එවායේ පිටපත්.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නිලධාරීන්ගෙන් මෙම සහතික අනවශ්‍යය.)

(iv) ධුරාපේක්ෂකයාගේ සිංහල/දෙමළ දැනීම පිළිබඳව සෑහෙන සහතිකයක් හෝ වෙනත් ලේඛනගත සාක්ෂි.

රජයේ සේවයෙහි නියුක්ත වූවන් චරිත සහතිකවල පිටපත් එවීමෙන් පමණක් නිදහස් කරනු ලබන බව සැලකිය යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම ස්ථිර ලේකම්ට හැර මෙම කාර්යාලයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිද බලනු මැනවි.

8. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. රජයේ පාඨශාලාවල හා අධ්‍යක්ෂ පාලිත පාඨශාලාවල ගුරුවරයන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රාදේශිය/දිස්ත්‍රික්කය භාර අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි මාර්ගයෙන් මෙම කාර්යාලයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන අංශය) වෙත ඉදිරිපත් කළයුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත යුතු බව නිර්දේශ නොකර තොත් ඒවා සලකා බලනු නොලැබේ.

9. ඉල්ලුම් පත්‍ර ලැබුන බව දන්වනු ඇත. දින 14 ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුණ බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙක් වේ නම් ඒ බව ස්ථිර ලේකම්වරයා වෙත දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

ස්ථිර ලේකම් සහ අධ්‍යාපන
අධ්‍යක්ෂ ජනරාල්.

අංකය : සාප/25/18
1969 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදීය.

12-1102—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදවේ දන්ත නිලධාරී තනතුරු

1. අංක 14,882 හා 1969 නොවැම්බර් මස 28 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යුද්ධ හමුදාවේ දන්ත නිලධාරී තනතුරු සඳහා අයදුම් පත් කැඳවීමේ දිනය සම්බන්ධව මෙහි පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලැබේ :—

6 වැනි ඡේදයෙහි—" 1969 දෙසැම්බර් මස 19 වැනි දින " ඉවත් කර " 1970 ජනවාරි මස 30 වැනි දින " යනුවෙන් යොදන්න.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද්ධ හමුදාධිපති වෙනුවට.

1969 දෙසැම්බර් මස 19 වැනි දින.

12-1092—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### වැඩපොළ පරිපාලක තනතුර

1969. 11. 28 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1969. 11. 17 වැනි දින දරණ දැන්වීම සම්බන්ධවයි. ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970. 1. 12 දින දක්වා දීර්ඝ කර ඇත.

අ. ම. මු. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්‍ෂ.

1969. 12. 20 වන දින,
කොළඹ 3, තැ. පෙ. 577,
බාලදක්ෂ මාවත, ගාලු මුවදොර,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේදීය.

12–1088—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය

### සංස්කෘත භාෂාව පිළිබඳ අධිකාලීන කථිකාචාර්ය තනතුර— දෙමළ මාධ්‍යය

ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ සංස්කෘත භාෂාව දෙමළ භාෂාවෙන් ඉගැන්වීම සඳහා අධිකාලීන කථිකාචාර්යවරයකු උවමනා කර තිබේ.

**සුදුසුකම්.**—1. බී. ඒ. උපාධිය, 2. දෙමළ භාෂාවෙන් ඉගැන්වීමේ හැකියාව හා පළපුරුද්ද.

**සේවය.**—සතියකට පැය 10 ක් පමණ ඉගැන්වීම කළ යුතුය. දිනකට පැය 2 ක් පමණ වේ.

**ගෙවීම.**—පැයකට රුපියල් 5 බැගිනි.

2. සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර සහිත ඉල්ලුම් පත්‍ර 1970.1.10 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන්ට සැලැස්විය යුතුය.

විද්‍යාලයාධිපති.

ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය,
බණ්ඩාරනායක පුර,
රාජගිරිය,
1969 දෙසැම්බර් මස 13 වැනි දින.

12–1142—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂම

### ආධුනික කිමිදුම්කරුවකුගේ තනතුර

මෙම දෙපාර්තමේන්තුවේ ආධුනික කිමිදුම්කරුවකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. මෙහි පහතින් දක්වා ඇති ආකෘතිය පරිදි සකස් කෙරුණු ඉල්ලුම්පත් 1970 ජනවාරි 12 දින හෝ ඊට ප්‍රථම හෝ මෙම කාර්යාලයට ලැබෙනසේ එවිය යුතුය.

2. **අධ්‍යාපනික සුදුසුකම්.**—අයදුම්කරුවන්, ගණිතය හා භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, එසේ නැතහොත් ගණිතය හා භෞතික විද්‍යා ඇතුළුව විෂයයන් 6 කින් සාමාර්ථය ලබමින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා එසේ නැතහොත් ගණිතය හා භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලැබූ සාමාර්ථයක් සහිතව රජයේ දෙපාර්තමේන්තුවක නැතහොත් පිළිගත් ඉංජිනේරු ආයතනයක කාර්මිකයෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්දක් හෝ කිමිදුම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් හෝ දැරිය යුතුය.

3. **වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවන්—(1) 1970.1.12 දිනට වයසින් 17 හැවිරිදි විය යුතු අතර වයස අවුරුදු 24 නොඉක්මවූ අය විය යුතුය.

(2) අවිවාහකයන් විය යුතුය.

(3) අතිශය යහපත් ශරීර සෞඛ්‍යයෙන් හා මනා දෘෂ්ටි ශක්තියෙන් යුක්ත විය යුතුය. පුහුණුව ආරම්භයට ප්‍රථම විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට ඔවුන්ට සිදුවනු ඇත.

4. **ආධුනිකත්වයට හා පුහුණුවට අදාල කොන්දේසි.**—තෝරාගනු ලබන අපේක්ෂකයා කිමිදුම්කරුවකු වශයෙන් පුහුණු කිරීමට පළමු ඔහුගේ යෝග්‍යත්වය මැනීනු සඳහා මුල් 6 මස තුළදී කිමිදීම පිළිබඳව පුහුණු කරනු ඇත. මෙම පරීක්ෂණ කාලය තුළදී ඔහු සුදුසුයයි පෙනී ගියහොත් තවත් අවුරුදු 2½ක පුහුණුවක් ඔහු ලබනු ඇත. පරීක්ෂණ කාලය තුළදී ඔහු යෝග්‍ය නොවේයයි හැඟුනහොත් ඔහුගේ ආධුනිකත්වය නවතා ලනු ලැබේ.

ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරුවකු/සුළු පරිපාලකයෙකු/මිනුම් හා මට්ටම්කරුවකු වශයෙන් දහවල් කාලයේ පවත්වන අරුද්දක් පමණවූ පාඨමාලාව සාර්ථකව අවසාන කළ අපේක්ෂකයින් පුහුණු කිරීමේ කාලය අවුරුදු 2 කි. ආධුනිකත්වය තුළදී අපේක්ෂකයන් දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා විභාගවලට යටත්වනු ඇත.

පුහුණු කිරීමේ මෙම කාලසීමාව සාර්ථකව අවසන් කැරුණායින් පසු අපේක්ෂකයා කිමිදුම්කරුවකු වශයෙන් කළයුතු කටයුතු පිළිබඳව තම ප්‍රවීණත්වය හා යෝග්‍යතාවය සනාථ කෙරේ නම්, ඔහු මෙම දෙපාර්තමේන්තුවේ "නාවි කිමිදුම්කරුවකු" වශයෙන් තුන් අවුරුද්දක් සේවය අවසන් කිරීමෙන් පසු තවදුරටත් පුහුණු කිරීම සඳහා ඔහු යෝග්‍ය යයි හැඟී ගියහොත්, පිටරට පුහුණුවක් ඔහුට ලබාදීමට පහසුකම් ඇත්තේ නම් නෞකා නිර්මාණ ශිල්පීය කිමිදුම් කරුවකු වශයෙන් ප්‍රවීණත්වයක් ලබාගැනීමට ඔහුට හැකිවන සේ අවුරුදු 1½ ක් දෙපාර්තමේන්තුව මගින් නිශ්චය කරන පරිදි එක්සත් රාජධානියේ හෝ වෙනත් රටක හෝ නෞකාංගනයක පුහුණු කිරීම සඳහා සලකා බලනු ඇත. නෞකා නිර්මාණ ශිල්පීය කිමිදුම්කරුවකුගේ කටයුත්තෙහි නියමිත පිටරට පුහුණුව සාර්ථකව අවසන් කරනු ලැබීමෙන් පසු ඔහු මෙම දෙපාර්තමේන්තුවේ කිමිදුම් කරුවකුගේ තනතුරට පත් කරනු ලැබේ.

5. පුහුණුවීමේ කාලය තුළදී ආධුනිකයකුට පහත දැක්වෙන පරිදි වැටුප් ගෙවනු ඇත :—

1 වැනි වර්ෂයේදී දිනකට රු. 2.80
2 වැනි වර්ෂයේදී දිනකට රු. 3.20
3 වැනි වර්ෂයේදී දිනකට රු. 3.60

නාවි කිමිදුම්කරුවකු වශයෙන් පත්වීම ලැබූකල්හි වර්ෂයකට රු. 6 304—රු. 144 හා රු. 180—රු. 8,040 වැටුප් පරිමාණය යටතේ වැටුප් ගෙවනු ඇත. කිමිදුම්කරුවකු වශයෙන් පත්වීම ලැබූ කල්හි වර්ෂයකට රු. 9,240—රු. 360—රු. 11,040 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබනු ඇත.

6. **ගිවිසුම්.**—තෝරාගනු ලබන අපේක්ෂකයා පරීක්ෂණ කාලය සාර්ථකව අවසන් කිරීමෙන් පසුව ආධුනිකත්වය තවදුරටත් පවත්වාගෙන යාමට අවසර ලබනුයේ නම්, තමා තම ආධුනිකත්වය සතුටුදායක පරිද්දෙන් සපුරා ඉන්පසුව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක් වත් දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන බවට එසේ කිරීම පැහැර හැරුණහොත් වරාය කොමසාරිස් විසින් නිශ්චය කෙරෙනු ලබන තාන්පත් මුදලක් රාජසන්තක කිරීමේ දඬුවමකට යටත්ව, තමාද තමාගේ භාරකරුද ගිවිසුමකට එළඹිය යුතුය. එයින් පසුව, නෞකාංගනයක පුහුණුව සඳහා තෝරාගෙන ඒ පුහුණුව සඳහා බැහැර යාමට ප්‍රථම, පුහුණුව පිළිබඳ මුළු වියදම දරන පරිදි හා පුහුණුවෙන් පසු ආපසු පැමිණ අවුරුදු 5 ක් රජයේ සේවය කරන බවට අපේක්ෂකයා තවත් බැඳුම්කරයකට එළඹිය යුතුය.

7. අපේක්ෂකයන් විසින් තම වයස හා සුදුසුකම් පිළිබඳ පරිපූර්ණ විස්තර එවීම ඉතා වැදගත් වන්නේය. මෙම අවශ්‍යතාවයන් සපුරා නොලන පරිදිවූ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. ඉල්ලුම් පත් සමඟ, මෑතදී ලබා ගැනුණු චරිත හා හැකියා සහතික පත් තුනක පිටපත් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළ කොට ඇති, රජයේ සේවයේ තනතුරු කෙරෙහි පත්වීම්වලට අදාල සාමාන්‍ය කොන්දේසි විමසා බැලීම මැනවි.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1969 දෙසැම්බර් මස 14 දින,
කොළඹ 1, කොළඹ වරාය කොමිෂන් සභාවේදීය.

## ඉල්ලුම් පත් ආකෘතිය

### කොළඹ වරාය කොමිෂමේ ආධුනික කිමිදුම්කරු තනතුර

1. නම සම්පූර්ණයෙන් :————.
2. ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. විවාහකද අවිවාහකද යන වග :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. කාර්මික සුදුසුකම් වේනම් ඒවා :————.
7. දැන්වීමේ විස්තර පරිදි ඔබ සුදුස්සෙකු වේද ? :————.
8. ඔබට ඇපයක් තැබිය හැකිද ? :————.

මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍යයයි ද නිවැරදි යයි ද මම මෙහිලා ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

12–1138—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය

### සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු

කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශයේ සංඛ්‍යා ලේඛන නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1970.1.31 වැනිදාට හෝ ඊට පෙර කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත ලැබෙනසේ එවිය යුතුයි.

2. **ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය, වර්ෂයකට රුපියල් 5,736 න් පටන් ගෙන රු. 144 වාර්ෂික පඩි වැඩිවීම් 6 කින්ද, රු. 180 වැඩිවීම් 8 කින් හා රු. 240 වැඩිවීම් 6 කින් යුතුවද, රු. 6,780, රු. 7,500 සහ රු. 8,280 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂිකව රු. 9,480 තෙක් නගින වැටුප් ක්‍රමයකි.

ඉහත සඳහන් වැටුප් ක්‍රමය 1969.10.1 දිනට පෙර මේ තනතුරට අදාල වූ රු. 3,180 න් පටන් ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 6 කින්ද, රු. 180 වැඩිවීම් 8 කින් හා රු. 240 වැඩිවීම් 6 කින් යුතුව ද, රු. 4,080, රු. 4,800 සහ රු. 5,580 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂිකව රු. 6,780 තෙක් නගින වාර්ෂික වැටුප් ක්‍රමයට අනුරූප වේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—සියලුම අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සහතික ඉදිරිපත් කළ යුතුය :—

(අ) පහත සඳහන් විෂයයන්ගෙන් ඕනෑම විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු විය යුතුය :—

(1) ආර්ථික විද්‍යාව.
(2) සංඛ්‍යා ලේඛන.
(3) ගණිතය.

1 වැනි හෝ 2 වැනි පෙළ ගෞරව උපාධිධාරීන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) 1970.1.31 වැනිදාට අවුරුදු 21 ට නොඅඩු බව හා අවුරුදු 35 කට නොවැඩි බව. දැනට රාජ්‍ය සේවාවේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙහි වයස් සීමාවන් බලපාන්නේ නැත.

5. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්වලට පහත දක්වෙන සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවසාථ පොතේ පරමාර්ථයන් උදෙසා නිකුත් කළ සහතික පත්‍ර හෝ පිළිගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) අයදුම්කරුගේ චරිතය පිළිබඳ ළඟදී ලබා ගන්නට යෙදුණු චරිත සහතික තුනක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන් විසින් මෙකී සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

**සංලක්ෂ්‍යය :** මෙකී සහතික පත් සහ චරිත සහතික පත්වල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. අයදුම් පත් හෝ ඒ සම්බන්ධයෙන් එවන අනිකුත් ඕනෑම ලිපියක් වෙතොත්, එවිය යුත්තේ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ට විනා පුද්ගලිකව මෙම අමාත්‍යාංශයේ වෙන කිසිම නිලධාරියෙකුට නොවේ.

7. ආණ්ඩුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් එවිය යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මගිනි. නියමිත දිනෙන් පසුව මෙම අමාත්‍යාංශයට ලැබෙන අයදුම් පත් භාර ගනු ලබන්නේ ඒවා නියමිත දිනට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලැබී තිබුණහොත්ද, ඒවා ප්‍රමාද වීමට සෑහෙන හේතු දක්වමින් එම අයදුම් පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් ද පමණකි.

8. මෙම ගැසට් පත්‍රයෙහි පළවෙනි කොටසේ මුල (II) වැනි ඡේදයෙහි දක්වෙන රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාල වූ පොදු කොන්දේසි කියවා බලන ලෙස ඉල්ලමි.

ඒ. ඇල්. බී. කේ. පෙරේරා,
කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම් වෙනුවට.

1969 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ 2,
අංක 48, ශ්‍රී ජිනරතන පාරේ,
කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ දීය.

## ආකෘති පත්‍රය

### කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය—සංඛ්‍යාලේඛන නිලධාරි තනතුර

1. දැන්වීමේ සඳහන් :————.
2. අයදුම්කරුගේ නාමය සම්පූර්ණයෙන් :————.
   (වාසගම මුලට)
3. තැපැල් ලිපිනය :————.
4. (අ) වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
   (ආ) විවාහක අවිවාහක බව :————.
5. ජාතිය සහ එය හිමිවූ අන්දම :————.
6. උපන් ස්ථානය :—
   * (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා :————.
7. අධ්‍යාපනික සුදුසුකම් හා අන්තිම වරට සමත් වූ විභාගයේදී ගන්නා ලද විෂයයන් (දින සහිතව) :————.
8. විශ්ව විද්‍යාලයෙන්/විද්‍යාලයෙන් අස්වූ දින සිට යෙදී සිටි රක්ෂාවන් හා රජයේ සේවයේ යෙදී සිටියා නම් ඒ පිළිබඳ වකවානු සහ සම්පූර්ණ විස්තර :————.
9. සිංහල සහ දෙමළ කියවීම හා ලිවීම ගැන ඇති ප්‍රවීණතාවය :————.
10. විශේෂ සුදුසුකම් වෙතොත් ඒවා පිළිබඳ විස්තර (උදාහරණ : වෘත්තීය ආදී) :————.
11. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තනතුරු (එම සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුයි) :————.
12. විශේෂ හිමිකම් වෙතොත් ඒවා පිළිබඳ විස්තර (උදාහරණ : මෙවැනි තනතුරක ලත් පළපුරුද්ද) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම පිරවිය යුතුයි. ඔහු උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඈ) පිරවිය යුතුයි.

12–1178—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

### ආදර්ශ අයදුම් පත්‍රය

**ලංකා ප්‍රමිති කාර්යාංශයේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. සම්පූර්ණ නම (වාසගම මුලට) :————.
3. ලිපිනය :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :————.
5. ජාතිය :————.
6. සුදුසුකම් :— (අ) අධ්‍යාපනික (විෂයයන් සමග) :————.
   (ආ) වෘත්තීය :————.
7. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් හෝ අස්වීමෙන් පසු කළ රක්ෂා දින සහිතව (දරු නිල සහ ලැබූ වැටුප් පිළිබඳ විස්තර දිය යුතුයි.) :————.
8. පළපුරුද්ද :————.
9. විශේෂ සුදුසුකම් :————.
10. සිංහල ප්‍රවීණතාව :————.
11. මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනුයේ ................. දින ................. පළවූ දැන්වීමට අනුකූලව ය.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති සියලුම විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද ඒවා බව මෙයින් සහතික කරමි. එමෙන් ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් නුසුදුස්සකු වන බව ද තෝරා ගනු ලැබුවාට පසු මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව සොයාගනු ලැබුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට ඉඩ ඇති බව ද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–1261—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාර අංකය : 1/23/2/19 (ඒ).

### සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1969 නොවැම්බර්

යථෝක්ත විභාගය පිළිබඳව, 1969 අගෝස්තු 29 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 අගෝස්තු 21 වැනි දින දින දරණ නිවේදනයේ 2 වැනි ඡේදය සම්බන්ධයෙනි. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පුරවනු ලබන ඇබෑර්තු සංඛ්‍යාව දළ වශයෙන් 118 ක් බව විභාගාපේක්ෂකයින්ගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

12–1096—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

### ගණන් පරීක්ෂකයින් බඳවා ගැනීම සඳහා විශේෂ විභාගය—1967

1967 අප්‍රේල් මස 28 වෙනි දින අංක 14,746 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ පළ කැරුණ 1967 අප්‍රේල් 21 වෙනි දින දරන ගැසට් නිවේදනයෙන් දැනුම් දුන් ගණන් පරීක්ෂකයින් බඳවා ගැනීම පිළිබඳ විශේෂ විභාගය අවලංගු කළ බැවි විභාගාපේක්ෂකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. විභාග ගාස්තු යථා කාලයේදී ආපසු ගෙවනු ඇත.

එස්. ඩී. ඒ. වෝල්ටර්,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

1969 දෙසැම්බර් මස 17 වැනි දින,
ගණන් පරීක්ෂක කාර්යාලය,
කොළඹ 7.

12–1167—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

### බිම් මැනීම හා තලමිතිය පිළිබඳ විශේෂ ප්‍රායෝගික පරීක්ෂණය

බිම් මැනීම හා තලමිතිය පිළිබඳව සර්වේ ජනරාල්ගේ බලපත්‍රය නිකුත් කිරීම සඳහා විශේෂ ප්‍රායෝගික පරීක්ෂණයක්, අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත්, 1970 පෙබරවාරි මස 22 වෙනි දින සිට පවත්වනු ලබේ. සර්වේ ජනරාල්ගේ බලපත්‍රය සඳහා වූ පරීක්ෂණයේ ලිඛිත කොටසින් කලින් සමත් වී සිටින්නෝ පමණක් මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුස්සෝ වෙත්.

2. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ දිස්ත්‍රික්කය ඇතුළතය.

3. ඉහත කී පරීක්ෂණයට ඇතුළත් වීමට ව්‍යවස්ථානුකූලව නියමිත ආකෘතිපත්‍රවල අයදුම්පත් පිළියෙල කළ යුතු වේ. මෙම ආකෘතිපත්‍රය කොළඹ 5, කිරුළ පාරේ සර්වේ ජනරාල් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

4. අයදුම්පත්‍ර භාර ගැනීම අවසාන වන දිනට, එනම්, 1970 ජනවාරි මස 21 දිනට ප්‍රථමයෙන් අයදුම්කරුවෝ පහත සඳහන් පරිදි විභාග ගාස්තු සර්වේ ජනරාල්ට ගෙවිය යුතුය.

බිම් මැනීම පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 30.00
තලමිතිය පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 30.00
බිම් මැනීම හා තලමිතිය පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 50.00

5. ලිඛිත පරීක්ෂණයේ බිම් මැනීම හා තලමිතිය පිළිබඳ නිර්දේශ පත්‍රය අනුව පිළියෙල කරනු ලබන පරීක්ෂණය පැවැත්වෙන වේලාව සහ ස්ථානය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට යථා පරිදි දැනුම් දෙනු ලැබේ.

6. පරීක්ෂක තැන විසින් නියම කරනු ලබන වේලාවන් අතරතුර අයදුම්කරුවෝ ක්ෂෙත්‍රයේ වැඩ කළ යුතු අතර යහපත් තත්ත්වයක ඇති උපකරණවල ඇති දෝෂ සදොස් වැඩ සම්බන්ධයෙන් සමාවට කාරණයක් සේ නොපිළිගැනේ. පරීක්ෂණ වේලාවල දී කිසිවෙක් හා කථාබස් කරන අයදුම් කරුවන් විභාගයට නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

7. සියළුම අයදුම්කරුවෝ, පෝල් රිටි, කූඤ්ඤා, ඇඳීම් උපකරණ, ලිපි ද්‍රව්‍ය යනාදී ස්වකීය උපකරණ සහ කම්කරුවන් සපයා ගත යුතු අතර, පරීක්ෂණයේ දී ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපයා දීම සම්බන්ධයෙන් කුමන විධියේ හෝ ආධාරයක් නොදෙනු ඇත.

8. 1970 ජනවාරි මස 21 වෙනි දිනට පසුව කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

9. පරීක්ෂණය සඳහා පෙනී සිටින සෑම අයදුම්කරුවෙක් ම, පරීක්ෂණයේ දී, විභාග පරිපාලකගේ තෘප්තියට හේතු වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. පහත සඳහන් ලිපි ලේඛන වලින් කුමක් වුවත් ඉදිරිපත් කිරීමෙන් එවැනි සාධක සැපයිය හැකිවේ :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බල පත්‍රයක් ;

(ඇ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායා රූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

සංලක්ෂ්‍යය.—පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන අනන්‍යතා පත්‍ර සඳහා අයදුම්පත් පෝරම දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත හැකිය.

10. අවශ්‍ය පරිදි අනන්‍යතාව ඔප්පු කරන සාධක ඉදිරිපත් නොකළහොත් කිසිම අයදුම්කරුවෙකුට එම පරීක්ෂණයට පෙනී සිටීමට හෝ පෙනී සිටීමට හිමිකම් ලැබීමට ද අවසරයක් නොමැත.

11. සියළුම ලියකියවිලි පෞද්ගලිකව මා නමට නොව "සර්වේ ජනරාල්" නමට එවිය යුතුය.

12. (අ) වරක් තැන්පත් කරනු ලැබූ විභාග ගාස්තු කිසියම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

(අ) සාධාරණ හේතුන් උඩ විභාගයෙන් ඉවත්වීමේ දැන්වීම 1970.2.9 වැනි දිනට හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ඉදිරිපත් කරන අයදුම්කරුවන් හට ඊළඟ විභාගයට පමණක් නොමිළයේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඇ) සාධාරණ හේතුන් උඩ විභාගයෙන් ඉවත්වීමේ දැන්වීම්, අසනීපයෙන් නම් වෛද්‍ය සහතික සමග 1970.2.9 වැනි දිනට පසුව හා විභාගය ආරම්භ කිරීමට පෙර මෙම කාර්යාලය වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන අයදුම්කරුවන් හට, ඊළඟ විභාගයට පමණක් ගාස්තු භාග ප්‍රමාණයක් ගෙවා පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඈ) ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් අනුග්‍රහයන් ලබා නොගන්නා ලද හා විභාගය ආරම්භ කිරීමට පෙර, ඊට පෙනී සිටීමට තමන් හට නොහැකි වන බව දන්වා නොඑවන ලද අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ඔවුනට අහිමි කරනු ලැබේ.

සී. පී. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

1969 දෙසැම්බර් මස 5 වැනි දින,
කොළඹ 5,
තැ. පෙ. 506, කිරුළ පාරේ,
සර්වේ ජනරාල් කාර්යාලයේ දීය.

12–1136—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

**1970 වර්ෂයේ මරදානේ ලංකා කාර්මික විද්‍යාලයටද, අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයටද, රත්මලාන, ගාල්ල, මහනුවර, යාපනය, කුරුණෑගල, අනුරාධපුරය. කෑගල්ල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි කනිෂ්ඨ කාර්මික ආයතනවලටද, කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ කාර්මික තත්ත්වයේ පාඨමාලාවලටද ඇතුළත්වීම සඳහා වන විභාගය පිළිබඳ ව්‍යවස්ථා**

මෙම ව්‍යවස්ථා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහභාගිත්වය ඇතිව, සකස් කර තිබෙන අතර, මෙම විභාගය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන්, විභාග කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබේ.

(අ) පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් සඳහාද, පාඨමාලාවල විෂය මාලා සම්බන්ධ විස්තර සඳහාද, ප්‍රවේශ විභාගයෙන් හා පාඨමාලාවේ ඇතැම් කොටස්වලින් නිදහස් කිරීම් සම්බන්ධයෙන්ද, මෙම ආයතනවලට ඇතුළත්වීම පිළිබඳව ලංකා උසස් කාර්මික විද්‍යායතනය හා ලංකා කාර්මික විද්‍යාලය මගින් නිකුත් කර ඇති අත්පොත් බැලිය යුතු අතර, අනිකුත් සියළුම අවස්ථා සම්බන්ධයෙන් ඒ ඒ විද්‍යාලවල විද්‍යාලයාධිපතිවරයන්ගෙන් විමසිය යුතු වේ. ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් නොවන පාඨමාල නොපැවැත්වීමට ඉඩ තිබේ.

(ආ) ඇතුළත් වීම සඳහා වන යෝග්‍යතා කොන්දේසි පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් වේ.

(ඉ) තෝරාගනු ලබන ඒ ඒ පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේ නම්, විභාගාපේක්ෂකයෙකුට එක් පාඨමාලාවකට වැඩි ගණනකට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කළ හැකිය. පාඨමාලා එකකට වැඩි ගණනකට ඇතුළත්වීම සඳහා ඔහු සුදුසුකම් ලබා සිටින්නේ නම්, එක්නරා පාඨමාලාවක් හෝ පාඨමාලා හෝ අපේක්ෂකයා විසින් අනුගමනය කළ යුතුයයි අවසාන වශයෙන් තීරණය කිරීමේ අයිතිය සතු අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයට යටත්ව ඔහුට කැමති පාඨමාලාව තෝරාගත හැකිය.

(ඊ) සන්ධ්‍යා පාඨමාලාවක් සඳහා ඇතුළත්වීම, එම ක්ෂෙත්‍රයේ රැකියාවෙහි නියුක්ත අය සඳහා සීමා කරනු ලැබේ.

(උ) කවර හෝ ආයතනයක මූලික ඉංජිනේරු විද්‍යා විභාගයකින් සාමාර්ථය ලැබ වෙනත් ආයතනයක සන්ධ්‍යා ඉංජිනේරු පාඨමාලාවක් සඳහා ඇතුළත් වීමට ඉල්ලුම් කරන ශිෂ්‍යයින් විසින් එම පාඨමාලාව සඳහා නියමිත ප්‍රවේශ විභාගයට පෙනී සිටීම අවශ්‍ය වේ.

2. **විභාග මධ්‍යස්ථාන** :—(i) විභාගය පහත දැක්වෙන ස්ථානවල පවත්වනු ලැබේ :— කොළඹ, මඩකලපුව, කෑගල්ල, රත්නපුරය, මහනුවර, ගාල්ල, යාපනය, කුරුණෑගල, බදුල්ල සහ අනුරාධපුරය.

(ii) විභාගාපේක්ෂකයින් විසින් එක මධ්‍යස්ථානයක් පමණක් නම් කළ යුතුය.

(iii) විභාගාපේක්ෂකයෙකු විසින් තෝරාගන්නා ලද මධ්‍යස්ථානයක් වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

3. **ප්‍රවේශ විභාගයට පෙනී සිටීමේ යෝග්‍යතාව** :—විභාගාපේක්ෂකයෙකු— (i) මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) ලංකා පුරවැසියෙකු විය යුතුය.

(iii) විභාගය සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී, ඇතුළත්වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ලබා සිටිය යුතුය. (1969 දෙසැම්බර් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ ප්‍රතිඵල අපේක්ෂා කරන අයටද ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉල්ලුම් කළ හැකිය.) මෙම රෙගුලාසි අවසානයේ ඇති චක්‍රයේ ඒ ඒ පාඨමාලාවලට අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් සඳහන් කර ඇත.

**සැලකිය යුතුය.**—(i) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යමය පාඨමාලාවල මාධ්‍යය අනුව, ඇතුළත්වීමේ යෝග්‍යතා කොන්දේසි වෙනස් විය හැකිය.

(ii) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් අවශ්‍ය ස්ථානයන්හි අ.පො.ස. (සා.පෙ.) විභාගයේ " අ " හෝ " ආ " නිර්දේශයෙන් සාමාර්ථයක් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා (ඉංග්‍රීසි) සහතිකය හෝ භාරගනු ලැබේ.

(iii) ගණිතය යන විෂයයෙන් සාමාර්ථයක් අවශ්‍ය ස්ථානයන්හි, මූලික ගණිතයෙන් හෝ ශුද්ධ ගණිතයෙන් හෝ උසස් ගණිතයෙන් හෝ ලත් සාමාර්ථයක් පිළිගනු ලැබේ.

(iv) යම් විභාග අපේක්ෂකයකු විසින්, අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී සාමාර්ථය ලබා තිබිය යුතු කිසියම් විෂයයකින් අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී සාමාර්ථය ලබා තිබුනොත්, ඔහු එම විෂයයෙන් නිදහස් කළ හැකිය.

4. **වයස් සීමාව** :—වයස් සීමාව පිළිබඳ විස්තර එක් එක් පාඨමාලාව සඳහා අවශ්‍ය සුදුසුකම් යටතේ දැක්වේ.

5. **ලිඛිත විභාගය පැවැත්වෙන දිනය** :—මෙම විභාගය, 1970 අප්‍රේල් 25 වැනි දින ආරම්භ වේ.

6. **සම්මුඛ පරීක්ෂණය** :—ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබාගන්නා සෑම අපේක්ෂකයෙකු විසින්ම සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමද අවශ්‍ය විය හැකිය. දිනය හා වේලාව, අදළ ආයතනයන්හි ප්‍රධානියා විසින් ඔහුට දන්වනු ලැබේ.

7. **භාෂා මාධ්‍යය** :—සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් සාමාන්‍ය යාන්ත්‍රික දැනීම හා අංක ගණිතය " සී " යන ප්‍රශ්න පත්‍ර ඇති අතර ලිඛිත විභාගය සඳහා වන අනෙක් සියලුම ප්‍රශ්නපත්‍ර, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ඇත.

8. **විභාග අපේක්ෂකයා ඇතුළත්වීමට බලාපොරොත්තු වන කාර්මික ආයතනය** :—කාර්මික ආයතන දෙකකට ඇතුළත්වීම සඳහා අපේක්ෂකයින්ට තරහ කළ හැකිය. ඉල්ලුම්පත්‍ර ආකෘතියේ සළසා ඇති කොටුවෙහි අපේක්ෂකයින් විසින් තම රුචිකත්වය අනුව, පිළිවෙලින් කාර්මික ආයතන දෙකක් නම් කළ යුතුයි.

9. **කාල සටහන** :—

**පළමු දිනය :** පෙ.ව. 9.00 සිට පෙ. ව. 11.00 දක්වා—ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම.
පෙ.ව. 11.15 සිට පෙ.ව. 11.45 දක්වා—සාමාන්‍ය බුද්ධිය.
ප.ව. 1.00 සිට ප.ව. 3.00 දක්වා—ශුද්ධ ගණිතය.
ප.ව. 3.15 සිට ප.ව. 4.15 දක්වා—රචනය (සිංහල/දෙමළ)

දෙවැනි දිනය : පෙ.ව. 8.30 සිට පෙ.ව. 9.30 දක්වා—රචනය (ඉංග්‍රීසි).
පෙ.ව. 9.45 සිට පෙ.ව. 11.45 දක්වා—අංක ගණිතය '' ඒ '',
ප.ව. 12.30 සිට ප.ව. 2.30 දක්වා—භෞතික විද්‍යාව,
ප.ව. 2.45 සිට ප.ව. 4.45 දක්වා—අංක ගණිතය '' බී ''.

තුන්වැනි දිනය : පෙ.ව. 8.30 සිට පෙ.ව. 10.30 දක්වා—මූලික ගණිතය,
පෙ.ව. 10.45 සිට ප.ව. 12.45 දක්වා—ව්‍යවහාරික ගණිතය,
ප.ව. 1.45 සිට ප.ව. 3.45 දක්වා—අංක ගණිතය '' සී '',
ප.ව. 4.00 සිට ප.ව. 4.45 දක්වා—සාමාන්‍ය යාන්ත්‍රික දැනීම.

10. **ප්‍රවේශ විභාගයේ විෂයයන් පිළිබඳ නිර්දේශ පත්‍ර :—**

(අ) ශුද්ධ ගණිතය—අ.පො.ස. (සා.පෙ.) විභාගයේ වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය යන විෂයයන් සඳහා අවශ්‍ය පරිදි වේ. අංක ගණිත ප්‍රශ්න කිසිවක් දෙනු නොලැබේ.

(ආ) මූලික ගණිතය—අ.පො.ස. (සා.පෙ.) විභාගයේ වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය යන විෂයයන් සඳහා අවශ්‍ය පරිදි වේ. එහෙත් දෙනු ලබන ප්‍රශ්න වඩා මූලික අන්දමේ ඒවාය. සංකීර්ණ ගැටළුවලට හා සිද්ධාන්තයට අදාළ ප්‍රශ්නවලට වඩා අවධාරණය වැඩියෙන් යොමු කරනු ලබන්නේ, යාන්ත්‍රික හා අපෝහන වැඩ සඳහාය. අංක ගණිත ප්‍රශ්න කිසිවක් දෙනු නොලැබේ.

(ඇ) අංක ගණිතය, '' ඒ '', භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, ජ්‍යාමිතික සහ යාන්ත්‍රික ඇඳීම—අ.පො.ස. (සා.පෙ.) විභාගයට අවශ්‍ය පරිදි වේ.

(ඊ) අංක ගණිතය '' බී ''—අ.පො.ස. (සා.පෙ.) විභාගයේ වාණිජ ගණිතය සඳහා අවශ්‍ය පරිදි වේ.

(උ) අංක ගණිතය '' සී ''—ක්‍රම සතර, ඉංග්‍රීසි හා මෙට්‍රික් මිනුම් ක්‍රම වර්ගඵල හා සෘජු කෝණාශ්‍ර, චතුරශ්‍ර සරල රේඛීය රූප සහ වෘත්ත, පෙට්ටි සිලින්ඩර සහ ගෝලවල පරිමාව.

(ඌ) රචනය—දී ඇති විෂයයන් කීපයකින් එකක් අපේක්ෂකයින් විසින් තෝරාගත යුතු වේ. ව්‍යාපාර, වාණිජ, කර්මාන්ත, විද්‍යා, ලෝක හා ප්‍රාදේශීය සිද්ධීන් හෝ ප්‍රශ්න ආදිය පිළිබඳව රචනා මාතෘකා දෙනු ලැබේ. නිවැරදි, පැහැදිලි භාෂාව හා තර්කානුකූල චින්තන ශක්ති වර්ධනය කෙරෙහි, වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(ඔ) සාමාන්‍ය යාන්ත්‍රික දැනීම—සාමාන්‍ය කර්මාන්ත ශාලා උපකරණ යන්ත්‍ර ආදිය ගැන අපේක්ෂකයාගේ අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර දෙනු ලැබේ.

11. **ගාස්තු :**—(i) එක් පාඨමාලාවට රුපියල් 5.00 බැගින් හා, සෑම අතිරේක පාඨමාලාවක් සඳහාම රුපියල් 2.50 බැගින් විභාග ගාස්තු අයකරනු ලැබේ.

(ii) ගාස්තු ගෙවිය යුතු වන්නේ, ආකෘති පත්‍රයෙහි ආදායම් මුද්දර ඇලවීමෙනි. අයදුම්කරුගේ අත්සන හා දතම යෙදීමෙන් එම මුද්දර අවලංගු කළ යුතුය. අවලංගු නොකර එවනු ලබන මුද්දර සඳහා, දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත.

12. **විභාගයට ඇතුළත් කරගැනීම :**—(i) රෙගුලාසි අනුව හා අවශ්‍ය ගාස්තු සමඟ අයදුම්පත් ඉදිරිපත් කර තිබෙන සියළුම අපේක්ෂකයින් විභාගයට ඇතුළත් කරගනු ලැබේ.

(ii) විභාගයට ඇතුළත් කරගැනීම සුදුසුකම පිළිගත් න්‍යායෙන් සැලකිය නොහැක. විභාගය සඳහා නුසුදුසු යැයි පෙනී ගිය හෝ, අවශ්‍ය තොරතුරු සඟවන ලද, හෝ වැරදි තොරතුරු සපයන ලද, හෝ අපේක්ෂකයකු විභාගය පැවැත්වෙන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ පාඨමාලාවක් තුළදී හෝ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව වුවද, හෝ විභාගය සඳහා නුසුදුස්සකු වේ.

13. **ඇතුල්වීම :**—(i) මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ආකෘති පත්‍ර පමණක් පාවිච්චි කළ යුතුය. 1970 ජනවාරි මස 5 වැනි දින සිට ජනවාරි මස 15 වැනි දින දක්වා මෙම ආකෘති පත්‍ර තම ලිපිනය ලියන ලද මුද්දර නොමැති දිග කවරයක් එවා ඉල්ලන සෑම කෙනෙකුටම තැපෑලෙන් නිකුත් කරනු ලැබේ. මෙම කවරවල වම් පැත්තේ උඩ කෙළවරේ '' එස්.ජී. 94 '' යන්න සඳහන් කළ යුතුයි. මෙම ආකෘති පත්‍ර පැමිණ ඉල්ලන අයට ඒ ඒ කාර්මික ආයතනවලින් ජනවාරි මස 18 වැනි දින සිට 24 වැනි දින දක්වා හා මෙම කායර්‍යාලයෙන් ජනවාරි මස 18 වැනි දින සිට ජනවාරි මස 24 වැනි දින දක්වා ලබාගත හැක.

(ii) අපේක්ෂකයා විසින් ඇතුළත්වීමේ ආකෘතිපත්‍රය සම්පූර්ණ වශයෙන් හා නිවැරදිව පිරවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රයක් ගැන සුදුසු පරිදි නිශ්චය කොට, විභාගයට පෙර ප්‍රතික්ෂේප කිරීම හෝ විභාගයෙන් පසුව අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ගේ අවධානය පහත සඳහන් කරුණු සඳහා යොමු කරවනු ලැබේ :—

(අ) රැකියාවෙහි නියුක්ත අපේක්ෂකයන් විසින් සිය ඇතුළත්වීමේ ආකෘතිපත්‍ර, තම සේවායෝජකයින්ගේ හෝ තම දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය ප්‍රධානීන් මගින් එවිය යුතුය.

(ආ) අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුත්තේ, ඒ සඳහා බලය ලත් තැනැත්තෙකු විසිනි. සේවයෙහි නියුක්ත අපේක්ෂකයින් සේවායෝජකයා ලවා හෝ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය ප්‍රධානීන් ලවා සිය අත්සන සහතික කරවාගත යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද ආකෘතිපත්‍ර, 1970 ජනවාරි මස 25 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, විභාග කොමසාරිස්වරයා වෙත එවිය යුතු වේ.

(iv) ඉල්ලුම්පත්‍ර ලැබුන බව දන්වනු නොලැබේ.

(v) ඉල්ලුම්පත්‍රයට ලිපි ලේඛන ඇමිණිය යුතු නොවේ.

14. **(i) ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම :—**

(අ) අසම්පූර්ණ හා දෙස් සහිත හෝ රෙගුලාසි අනුකූල නොවන,

(ආ) නියමිත ගාස්තු නොදරන,

(ඇ) ඉල්ලුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව දෙපාර්තමේන්තුවට ලැබෙන, ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට, ඒ බව අදාළ අපේක්ෂකයාට දැනුම් දෙනු ලැබේ. අපේක්ෂකයා විභාගයට පෙනී සිටියේ නම්, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ii) ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේදී හෝ අපේක්ෂකත්වය අවලංගු කිරීමේදී, ගාස්තුව රාජසන්තක කරනු ලැබේ.

15. **විභාගයෙන් ඉවත්වීම හෝ විභාගයට නොපැමිණ සිටීම හා ගාස්තු ආපසු ගෙවීම :—** (i) විභාගයෙන් ඉවත්වීම සඳහා වන දැන්වීම, ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට ප්‍රථම දෙපාර්තමේන්තුවට ලැබුණි නම්, ගෙවන ලද ගාස්තුවෙන් 90%ක් ආපසු ගෙවනු ඇත.

(ii) කවර හෝ කරුණක් සඳහා වුවද, විභාගයට නොපැමිණ සිටීම ඇතුළුව වෙනත් සියළුම අවස්ථා සම්බන්ධයෙන් ගාස්තුව හෝ ඉන් කිසිම කොටසක් ආපසු ගෙවීම සඳහා අවසර දෙනු නොලැබේ.

(iii) කෙසේ වුවද, අපේක්ෂකයා කිසිම ප්‍රශ්න පත්‍රයකට හෝ පෙනී නොසිටියේ නම්, ඔහුගේ මරණය හෝ ඔහුට වැළඳී ඇති ඉතා බලගතු හෝ කල්ගත වන රෝගයක් (නි. ව. ක්ෂය රෝගය, අංගභාගය, මානසික හෝ නහරගත රෝග) හේතු කොට ගෙන, ගාස්තුවෙන් සියයට 90ක මුදලක් ආපසු ගෙවනු ලැබේ. එවැනි ආපසු ගෙවීමක් ඉල්ලුම් කිරීමේ අයදුම්පත, විභාගයේ අවසාන දින සිට දින 30ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ.

16. **ප්‍රවේශ පත්‍ර :**—(i) විභාගය පැවැත්වීමට දින 7කට පමණ පෙර, පුවත්පත් මගින් හා ගුවන් විදුලිය මගින් ප්‍රවේශපත්‍ර නිකුත් කළ බව සඳහන් දැන්වීමක් කරනු ලැබේ. එවැනි දැන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙකුම සැලකිල්ලෙන් සිට, එහි සඳහන් උපදෙස් අනුව වහා ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවෙකුට ප්‍රවේශපත්‍රයක් නොලැබුණ හොත් ඔහු විසින් කොළඹ 2, කොම්පඤ්ඤවීදියේ, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුව වෙත ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව නොපමාව දන්වා එවිය යුතුය (විදුලි පුවතකින් මෙසේ දැන්වීම, වඩා හොඳය) (විදුලි පණිවුඩ ලිපිනය, ''විභාග'' කොළඹ). පැමිණ විමසන අපේක්ෂකයින් කොළඹ 13, කොටහේනේ (පෙර ආදුරුප්පු වීදිය) ශ්‍රී රත්නජෝති සරවනමුත්තු මාවතේ අංක 130 සිහිටි මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රවේශපත්‍ර ශාඛාවෙන් තොරතුරු විමසිය යුතුයි. එවිට පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :—

(අ) විභාගයේ නම :————.

(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(ඇ) අයදුම්කරුගේ ලිපිනය :————.

(ඈ) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය :————.

(ඉ) අයදුම්පත්‍රය එවූ දිනය, එය ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි කළ අංකය :————.

17. හැඳින්වීමේ පත්‍ර.—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී එක් එක් විෂයයට පෙනී සිටින විට විභාග ශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමා පිළිබඳ අනන්‍යතාව ඔප්පු කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පහත දැක්වෙන ලියවිලිවලින් කවර හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල්තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක්.

(ආ) විභාග දිනට කලින් තුන් අවුරුද්දක් ඇතුළත නිකුත්කරන ලද, වලංගුව පවත්නා '' පාස්පෝට් '' බලපත්‍රයක්.

(ඉ) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ රජයේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ සංස්ථාවක් මගින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් වෙනත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දවූද, තම ඡායාරූපය දරන්නාවූද, සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්,

(ඊ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින්, පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරන ඡායාරූපයක් :—

පසුපිටෙහි සඳහන් ඡායාරූපය, මෙහි අත්සන් කර ඇති.....................................යන අයගේ බව, මම සහතික කරමි.
(අයදුම්කරුගේ සම්පූර්ණ නම)

————,
අයදුම්කරුගේ පුරුදු අත්සන.

————,
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

නම සහ තරාතිරම :————.

දිනය :————.

මෙම ඡායාරූප පිටපත විභාගශාලාධිපති වෙත රඳවාගනු ඇත. ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි ඉල්ලුම්කරුවකුගේ අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

18. ලිපිලේඛනාදිය :—(i) පහත සඳහන් ලිපිලේඛනවලින් සමහරක් හෝ සියල්ලම හෝ අවශ්‍ය වනු ඇත :—

(අ) ප්‍රභූන් දෙදෙනෙකුගෙන් චරිත සහතික, මෙම චරිත සහතික මෑතදී ලබාගත් ඒවා වියයුතු අතර, අයදුම්කරු, යටත්පිරිසෙයින් අවුරුදු පහකට වැඩි කාලයක් පෞද්ගලිකව හඳුනන තැනැත්තන් ගෙන් විය යුතුය. හොඳින්ම පිළිගත හැකි සහතික වන්නේ, පාසැල් ප්‍රධානියන්ගෙන් හෝ අයදුම්කරු පදිංචිව සිටින නගරයේ හෝ ගමේ පදිංචි නිලධාරීන්ගෙන් ලබාගන්නා සහතික වේ.

(ආ) උප්පැන්න සහතිකය හෝ වයස දැක්වෙන විශේෂ සහතිකය,

(ඉ) ලංකා පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කරන ලද සහතික හෝ පරම්පරාවෙන් පුරවැසි භාවය ඉල්ලුම් කිරීම පිළිගැනීමේ, රජයෙන් ලද මුල් ලිපිය (අදාළ වන පරිදි),

(ඊ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අ.පො.ස. සහතික පත්‍රය (හෝ මෙම සහතික පත්‍ර තවමත් නිකුත් කර නොමැති අවස්ථාවන් සම්බන්ධයෙන්, බාහිර අපේක්ෂකයින් වෙත නිකුත් කරන ලද ප්‍රතිඵල ලේඛන හෝ පාඨශාලීය අපේක්ෂකයෙක් නම්, පාසැල් ප්‍රධානියාගෙන්ම ලබාගත් ප්‍රකාශයක්) මෙම ප්‍රකාශයට නම, විභාගය පවත්වන ලද මාසය හා වර්ෂය, විභාග අංක, විෂය හා ශ්‍රේණිය යන කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් විය යුතුය.

(උ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ 8 වැනි ප්‍රමාණයේ සහතික පත්‍රය අවශ්‍ය තන්හි, පාසැල විසින් හෝ විධිමත් හා නිල වශයෙන් නිකුත් කළ සහතික පත්‍රයක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක් හෝ පාසැල පිළිබඳව හා අයදුම්කරු පාසැලට පැමිණි කාල පරිච්ඡේදය පිළිබඳ සම්පූර්ණ විස්තර දැක්වෙන පාසැල් ප්‍රධානියා විසින්ම නිකුත් කරන ලද ප්‍රකාශයෙක්,

(ඌ) පාඨමාලාවකට ඇතුළත්වීම සඳහා අවශ්‍ය වන අධ්‍යාපනික සුදුසුකම් තහවුරු කරන වෙනත් කවර හෝ සහතික පත්‍රයක්,

(එ) අවශ්‍ය පරිදි සේව්‍යයාගෙන් ලබාගත් සහතිකයක්.

(ii) මෙම ලිපිලේඛන හෝ ඒවායේ පිටපත් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු නොවේ. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත්, පරීක්ෂක මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම සඳහා, එම ලිපිලේඛන සූදානමින් තැබිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය හා පිළිගත හැකි ලිපිලේඛන ඉදිරිපත් කළේ වී නමුත්, යෝග්‍යතාව ඔප්පු කිරීමට නොහැකිවන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

(iii) උපදෙස් නොසලකා, අයදුම්පත් සමග ලිපිලේඛන එවනු ලබන අයදුම්කරුවන්ගේ එම ලිපි ලේඛන නැතිවුවහොත්, ඒ ගැන දෙපාර්තමේන්තුව විසින් වග නොකියනු ඇත.

(iv) සිය ලිපිලේඛනවල සත්‍යාසත්‍යතාව පිළිබඳව අයදුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතුය. වංචනිකව වෙනස් කළ හෝ හොර අත්සන් තබන ලද හෝ සඳහන් කරුණු අසත්‍යවන හෝ ලිපිලේඛන ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට තදබල දඬුවම් පමුණුවනු ලැබේ.

19. මෙහි රෙගුලාසිවල සපයා ඇති කිසියම් කරුණක් වේ නම්, ඒ පිළිබඳව අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සමග සාකච්ඡා කොට, විභාග කොමසාරිස්වරයාගේ අභිමතය අනුව ක්‍රියා කරනු ලැබේ.

කේ. ඊ. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1969 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ දීය.

## ඉංජිනේරු පාඨමාලා

| පාඨමාලාවේ අංකය (1) | පාඨමාලාවේ නම (2) | පාඨමාලාවේ ස්වභාවය (3) | අවශ්‍ය සුදුසුකම් (4) | ප්‍රවේශ විභාගයේදී ගතයුතු විෂයයන් (5) | පැවැත්වෙන ස්ථාන (ඉගැන්වීමේ මාධ්‍ය සමග) (6) |
|---|---|---|---|---|---|
| 1. | ආධුනික සැලසුම්කරු ප්‍රාරම්භක | ... පූර්ණකාල දිවා—එක් අවුරුදු | ... අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගයේ විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. එම විෂයයන් හය (අ) සිංහල භාෂාව/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව ; (ආ) ගණිතය ; හා (ඉ) වෙනත් විෂයයන් හතරක් විය යුතුය ; නැතහොත්<br>ගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ලබා තිබිය යුතුය. (ගණිතයෙන් සාමාර්ථය වෙනම අවස්ථාවක අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ලබාතිබිය හැකිය.<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය ...<br>(3) පහත සඳහන් විෂයයන් අතුරෙන් එකක් —<br>ව්‍යවහාරික ගණිතය<br>භෞතික විද්‍යාව<br>ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රීසි), යාපනයේ (දෙමළ), හා මහනුවර (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනයන්. |
| 2. | මැනුම්කරු හා මට්ටම්කරු | ... පූර්ණකාල දිවා—එක් අවුරුදු | ... ශුද්ධ ගණිතයට සම්මාන සාමාර්ථයක් හා (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි : (ආ) භෞතික විද්‍යාව (ඉ) වෙනත් විෂයයන් 3 කට සාමාන්‍ය සාමාර්ථ යද ඇතිව අ.පො.ස.(සා.පෙ.) විෂයයන් 6 කින් සාමාර්ථය ලබා තිබීම. (අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී මෙම විෂයයන්ගෙන් සාමාර්ථ ලබා තිබිය හැකිය.) හෝ ශුද්ධ ගණිතයට සම්මාන සාමාර්ථයක්; හා භෞතික විද්‍යාවට සාමාන්‍ය සාමාර්ථයක් දසහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ලබා තිබීම. (ශුද්ධ ගණිතයට සම්මාන සාමාර්ථය හා භෞතික විද්‍යාවට සාමාන්‍ය සාමාර්ථයද වෙනම අවස්ථාවක අ.පො.ස.(සා.පො.) විභාගයේදී ලබා තිබිය හැකිය.<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික ආයතනය (ඉංග්‍රීසි) අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය නේවාසික (ටිරිමින්ට පමණයි)—(ඉංග්‍රීසි) ගාල්ල (ඉංග්‍රීසි), යාපනය, (ඉංග්‍රීසි) මහනුවර (ඉංග්‍රීසි) බදුල්ල (සිංහල) යන කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි. |
| 3. | මැනුම්කරු හා මට්ටම්කරු | ... සන්ධ්‍යා—තුන් අවුරුදු | ... මැනුම්කරු හා මට්ටම්කරු පූර්ණකාල දිවා—එක් අවුරුදු පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් හෝ ප්‍රාරම්භක ඉංජිනේරු විද්‍යා පාඨමාලාව සමත්වීම.<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) ශුද්ධ ගණිතය ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යාතනය (ඉංග්‍රීසි) හා යාපනය (ඉංග්‍රීසි), මහනුවර (ඉංග්‍රීසි), ගාල්ල (ඉංග්‍රීසි), බදුල්ල (ඉංග්‍රීසි/සිංහල) යන කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | ඉංජිනේරු ආධුනික ... | අර්ධකාල දිවා—දෑවුරුදු ... | අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. එම විෂයයන් හය (අ) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව (ආ) ගණිතය, (ඉ) භෞතික විද්‍යාව ; (ඊ) වෙනත් විෂයයන් තුනක් හෝ ; ගණිතය හා භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, ගණිතයෙන් හා භෞතික විද්‍යාවෙන් සාමාර්ථය වෙනම අවස්ථා වක අ.පො.ස.(සා.පෙ.) විභාගයේ දී ලබා තිබිය හැකිය. වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය (2) ශුද්ධ ගණිතය (3) ව්‍යවහාරික ගණිතය (4) භෞතික විද්‍යාව ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රිසි) |
| 5. | සන්ධ්‍යා ඉංජිනේරු (යාන්ත්‍රික නාගරික/විදුලි/නිර්මාන) | සන්ධ්‍යා—තුන් අවුරුදු ... | ඉංජිනේරු ආධුනික පාඨමාලාවට මෙනි ; හෝ ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුය. වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය (2) ශුද්ධ ගණිතය (3) ව්‍යවහාරික ගණිතය (4) භෞතික විද්‍යාව ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය හා රත්මලාන, යාපනය, මහනුවර හා කුරුණෑගල කණිෂ්ඨ කාර්මික ආයතනයන්හි ඉංග්‍රිසි මාධ්‍ය යෙන් පැවැත්වේ. |
| 6. | ප්‍රාරම්භක ඉංජිනේරු විද්‍යා ... | සන්ධ්‍යා—එක් අවුරුදු ... | 8 වැනි ශ්‍රේණිය හෝ 8 වැනි පන්තිය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය (2) මූලික ගණිතය ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රිසි) අනුරාධපුර (සිංහල), බදුල්ලේ (සිංහල/ඉංග්‍රිසි), ගාල්ලේ (ඉංග්‍රිසි), යාපනයේ (ඉංග්‍රිසි) මහනුවර (ඉංග්‍රිසි), කුරුණෑගල (සිංහල/ඉංග්‍රිසි), රත්මලාන (සිංහල/ඉංග්‍රිසි) හා කෑගල්ල (සිංහල) යන කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 7. | ගොඩනැගිලි නිර්මාණය ... | සන්ධ්‍යා—තුන් අවුරුදු ... | ප්‍රාරම්භක ආධුනික සැලසුම්කරු පාඨමාලාවට මෙනි, හෝ ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පාඨ මාලාව සම්පූර්ණ කොට තිබිය යුතුය. වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය | (1) සාමාන්‍ය බුද්ධිය (2) ශුද්ධ ගණිතය ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රිසි) බදුල්ලේ (සිංහල/ඉංග්‍රිසි), යාපනයේ (ඉංග්‍රිසි), මහනුවර (ඉංග්‍රිසි) රත්මලාන (සිංහල හා ඉංග්‍රිසි) කුරුණෑගල (සිංහල හා ඉංග්‍රිසි) කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 8. | ගොඩනැගිලි නිර්මානය ... | අර්ධකාල දිවා—තුන් අවුරුදු ... | ප්‍රාරම්භක ආධුනික සැලසුම්කරු පාඨමාලාවට මෙනි. වයස: 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය | (1) සාමාන්‍ය බුද්ධිය (2) ශුද්ධ ගණිතය ... | ... කටුබැද්දේ ලංකා උසස් හා කාර්මික විද්‍යායතනය (සිංහල), යාපනයේ (දෙමළ) හා මහනුවර (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනය. |
| 9. | වාස්තු විද්‍යාව ... | ... සන්ධ්‍යා—තුන් අවුරුදු ... | ආධුනික සැලසුම්කරු ප්‍රාරම්භක පාඨමාලාවට මෙනි, හෝ ඉංජිනේරු විද්‍යා ප්‍රාරම්භක පාඨ මාලාව සම්පූර්ණ කොට තිබිය යුතුය. වයස : 1970.10.1 දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය (2) ශුද්ධ ගණිතය ... | ... කටුබැද්දේ, ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රිසි) |
| 10. | භූගර්භ විද්‍යාව ... | ... සන්ධ්‍යා—දෑවුරුදු ... | අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව/දෙමළ භාෂාව/ඉංග්‍රීසි භාෂාව, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව ද සහිතව අ.පො.ස (සා.පෙ.) විෂයයන් 6 කින් සාමාර්ථය හෝ, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාවද සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය. භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව ද වෙනම අවස්ථා වක අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී ලබා තිබිය හැකිය. වයස : 1970.10.1 දිනට අවුරුදු 17ට නො අඩු විය යුතුය. | (1) වාක්‍ය රචනය (ඉංග්‍රිසි) (2) සාමාන්‍ය බුද්ධිය ... | ... කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනය (ඉංග්‍රිසි). |

## වාණිජ විද්‍යා පාඨමාලා

| පාඨමාලාව අංකය (1) | පාඨමාලාවේ නම (2) | පාඨමාලාවේ ස්වභාවය (3) | අවශ්‍ය සුදුසු කම් (4) | ප්‍රවේශ විභාගයේදී ගතයුතු විෂයයන් (5) | පැවැත්වෙන ස්ථාන (ඉගැන්වීමේ මාධ්‍ය සමග) (6) |
|---|---|---|---|---|---|
| 11. | තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ ඩිප්ලෝමාව | සිව් අවුරුදු (දිවා දැවුරුද්දක් හා ඉන්පසු සන්ධ්‍යා දැවුරුද්දක්) | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත් අ.පො.ස.(සා.පෙ.) විෂයයන් 6 කින් සාමාර්ථය. එම විෂයයන් හය අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබිය යුතුවා පමණක් නොව, ඉන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය ද තිබිය යුතුය.<br>වයස . 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) වාක්‍ය රචනය (ඉංග්‍රීසි) ...<br>(2) සාමාන්‍ය බුද්ධිය<br>(3) අංක ගණිතය ' අ ' හෝ ' ආ ' (පිළිගත් විශ්ව විද්‍යාලයන්හි උපාධිධාරීහු ලිඛිත පරීක්ෂණ යෙන් නිදහස් කරනු ලැබේ) | ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (ඉංග්‍රීසි). |
| 12. | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය | දිවා පාඨමාලාව—එක් අවුරුදු ... | ගණිතය හෝ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය සිංහල භාෂාව (සිංහල මාධ්‍ය අපේක්ෂක යන් සඳහා) හෝ දෙමළ භාෂාව (දෙමළ මාධ්‍ය අපේක්ෂකයන් සඳහා) හෝ ඉංග්‍රීසි භාෂාව (ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයන් සඳහා) ඇතිව අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙ.) විෂයයන් හයකින් සමත්ව සමත්ව තිබීම<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය ...<br>(2) අංක ගණිතය ' අ ' හෝ ' ආ '<br>(3) වාක්‍ය රචනය (සිංහල මාධ්‍ය) අපේක්ෂකයන් සිංහලෙන් ද, දෙමළ මාධ්‍ය අපේක්ෂකයන් දෙමළෙන් ද, ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයන් ඉංග්‍රීසියෙන් ද වාක්‍ය රචනය කළ යුතුය. | ... මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල, ඉංග්‍රීසි) බදුල්ල (සිංහල, ඉංග්‍රීසි) ගාල්ලේ (සිංහල, ඉංග්‍රීසි මහනුවර (සිංහල, ඉංග්‍රීසි) යාපනයේ (ඉංග්‍රීසි, දෙමළ) කෑගල්ලේ (සිංහල) කුරුණෑගල (සිංහල, ඉංග්‍රීසි) කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 13. | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය | සන්ධ්‍යා (පිළිගත් වෙළඳ ආයතනයක කාර්යාලයක රජයේ දෙපාර්තමේන්තු වක හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක හෝ වෙනත් ඕනෑම පිළිගත් ආයතන යක සේවකයන් සඳහා සීමා වේ) | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය පිළිබඳ දිවා කාල පාඨමාලාව මෙනි.<br>වයස : 1970.10.1 වැනි දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය දිවා පාඨශාලාව මෙනි | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල, ඉංග්‍රීසි) බදුල්ල (සිංහල, ඉංග්‍රීසි), ගාල්ල (සිංහල) යාපනයේ (ඉංග්‍රීසි, දෙමළ) මහනුවර (සිංහල, ඉංග්‍රීසි) කෑගල්ලේ (සිංහල) කුරුණෑගල (සිංහල, ඉංග්‍රීසි) කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 14. | ලඝු ලේඛන යතුරු ලියන්නන් සඳහා වාණිජ සහතිකය | දිවාකාල—එක් අවුරුදු ... | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකයට මෙනි.<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 නො අඩු විය යුතුය. | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය දිවා පාඨශාලාවට මෙනි | මරදානේ, ලංකා කාර්මික විද්‍යාලය (සිංහල, ඉංග්‍රීසි) බදුල්ලේ (සිංහල, ඉංග්‍රීසි) ගාල්ලේ (සිංහල, ඉංග්‍රීසි) යාපනයේ (දෙමළ, ඉංග්‍රීසි) මහනුවර (සිංහල, ඉංග්‍රීසි) කෑගල්ලේ (සිංහල) කුරුණෑගල (සිංහල, ඉංග්‍රීසි) කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 15. | ලඝු ලේඛන යතුරු ලියන්නන් සඳහා වාණිජ සහතිකය | සන්ධ්‍යා (පිළිගත් වෙළඳ ආයතනයක, කාර්යාලයක, රජයේ දෙපාර්තමේන්තු වක හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක හෝ වෙනත් ආයතනවල සේවකයන් සඳහා සීමා වේ) | පොත් තබන්නන් සඳහා වාණිජ සහතිකය පිළිබඳ පාඨමාලාවට මෙනි<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | පොත් තබන්නන් සඳහා වාණිජ සහතික දිවා පාඨ මාලාවට මෙනි | මරදානේ ලංකා කාර්මික විද්‍යාලයය, (සිංහල/ඉංග්‍රීසි), බදුල්ලේ (සිංහල, ඉංග්‍රීසි), යාපනයේ (දෙමළ-ඉංග්‍රීසි), මහනුවර (සිංහල, ඉංග්‍රීසි), කුරුණෑගල (සිංහල, ඉංග්‍රීසි), කණිෂ්ඨ කාර්මික ආයතන. |

| | | | | |
|---|---|---|---|---|
| 16. විකුණුම් ශාස්ත්‍රය හා විකුණුම් පරිපාලනය | එක් අවුරුදු–පෙර–පෝය දිනවල පමණකි. (අපරභාගය) (විකිණීමේ ක්‍රියාකාරීත්ව යන්හි නියුක්ත වූවන්ට සීමිතය) | සිංහල භාෂාව/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවස්ථා දෙකකට වැඩි නොවන වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් සාමාර්ථය. (සිංහල මාධ්‍යයේ අපේක්ෂකයින් සිංහල භාෂාවෙන්ද ඉංග්‍රීසි මාධ්‍යයේ අපේක්ෂකයින් ඉංග්‍රීසි භාෂාවෙන් ද, සමත්ව තිබිය යුතුය)<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය …<br>(2) වාක්‍ය රචනය (සිංහල මාධ්‍යයේ අපේක්ෂකයින් සිංහලෙන්ද, ඉංග්‍රීසි මාධ්‍යයේ අපේක්ෂකයින් ඉංග්‍රීසියෙන්ද, ලිවිය යුතුය), අ.පො.ස. (උ.පෙ.) විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය ලැබුවා වූ හෝ ඊට වඩා උසස් සුදුසුකම් ලැබුවා වූ හෝ අය ප්‍රවේශ විභාගයෙන් නිදහස් කරනු ලැබේ. | … මරදානේ ලංකා කාර්මික විද්‍යාලයය, (සිංහල, ඉංග්‍රීසි) |
| 17. ලඝු ලේඛකයින්ගේ සහතිකය | … දිවා කාල—එක් අවුරුදු | … විකුණුම් ශාස්ත්‍රයට හා විකුණුම් පරිපාටියනට මෙනි. දෙමළ අපේක්ෂකයින් අ.පො.ස.(සා.පෙ.) දෙමළ භාෂාවෙන් සමත්වී තිබිය යුතුය.<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | විකුණුම් ශාස්ත්‍රයට හා විකුණුම් පරිපාලනයට මෙනි. දෙමළ මාධ්‍ය අපේක්ෂකයන් දෙමළ භාෂාවෙන් වාක්‍ය රචනය කළ යුතුය. | මරදානේ ලංකා කාර්මික විද්‍යාලය (සිංහල, ඉංග්‍රීසි) යාපනයේ (දෙමළ, ඉංග්‍රීසි) කණිෂ්ඨ කාර්මික ආයතනය |
| 18. ලඝු ලේඛකයින්ගේ සහතිකය | … සන්ධ්‍යා, එක් අවුරුදු (මෙම හෝ මීට අදල රැකියාවක නියුක්ත වූවන්ට නියමිතය ) | අවස්ථා දෙකකට වැඩි නොවන වාර ගණනකදී, විෂයයකින් හයකින් අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් සාමාර්ථය. (සිංහල, මාධ්‍යයේ අපේක්ෂකයින් සිංහල භාෂාවෙන්ද, දෙමළ මාධ්‍යයේ අපේක්ෂකයින් දෙමළ භාෂාවෙන්ද, ඉංග්‍රීසි මාධ්‍යයේ අපේක්ෂකයින් ඉංග්‍රීසි භාෂාවෙන් ද සාමාර්ථය ලබා තිබිය යුතුය<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට නො අඩු විය යුතුය. | (1) සාමාන්‍ය බුද්ධිය …<br>(2) වාක්‍ය රචනය (සිංහල මාධ්‍යයේ අපේක්ෂකයින් සිංහලෙන්ද, දෙමළ මාධ්‍යයේ අපේක්ෂකයින් දෙමළෙන්ද, ඉංග්‍රීසි මාධ්‍යයේ අපේක්ෂකයින් ඉංග්‍රීසියෙන්ද ලිවිය යුතුය) අ.පො.ස. (උ.පෙ) විභාගයේ විෂයයන් තුනකින් සාමාර්ථය ලැබු වා වූ හෝ ඊට වඩා උසස් සුදුසුකම් ලැබුවා වූ හෝ අය ප්‍රවේශ විභාගයෙන් නිදහස් කරනු ලැබේ. | … මරදානේ ලංකා කාර්මික විද්‍යාලය, සිංහල, ඉංග්‍රීසි) යාපනයේ (දෙමළ, ඉංග්‍රීසි), මහනුවර (සිංහල, ඉංග්‍රීසි) යන කණිෂ්ඨ කාර්මික ආයතන |

අංක 12 හා අංක 14 දරන පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසුව පොත් තබන්නන් සඳහා උසස් වාණිජ සහතිකය සහ/හෝ ලඝු ලේඛන යතුරු ලියන්නන් සඳහා උසස් වාණිජ සහතිකය පිළිබඳ පාඨමාලාව හැදෑරිය හැකිය. (එක් අවුරුදු දි) තවද, පාඨමාලා දෙකම එකවිට හැදෑරීමට පහසුකම් සලසා ඇත.

**ඉතා සැලකිය යුතුයි.**—සන්ධ්‍යා පාඨමාලා රැකියාවන්හි නියුක්තවූවන්ට පමණක් සීමාකර ඇත.

**වෘත්තීය පාඨමාලා**

19—28.

| | | | | |
|---|---|---|---|---|
| 19-28 වෘත්තීය පාඨමාලා … මුල් සති 18 ක මූලික කාර්මික අභ්‍යාස යෙන් පසුව ඉතිරි කාලයේ පහත සඳහන් වෘත්තීන්ගෙන් එකකින් විශේෂ පුහුණුවක් දෙනු ලැබේ<br>19. හේත්තු වැද්දීම හා යන්ත්‍ර පුහුණුව (i)<br>20. ස්වයංක්‍රිය යාන්ත්‍රික විද්‍යාව (ii) (මෝටර් යාන්ත්‍රික විද්‍යාව)<br>21. වඩු වැඩ හා වැද්දුම් වැඩ (iii)<br>22. ගොඩනැගිලිවල විදුලි උපකරණ (iv) සවිකිරීම<br>23. පෙදරේරු ශිල්පය (v)<br>24. ලෝහ තහඩු වැඩ (vi)<br>25. කැබිනට් සෑදීම (vii)<br>26. හේත්තු වැද්දීම (viii)<br>27. යන්ත්‍රහල් පුහුණුව (ix)<br>28. රේඩියෝ හා ඉලෙක්ට්‍රොනික් යාන්ත්‍රික ශිල්පය (x) | … පූර්ණ දිවා—දෙවුරුදු … | … 8 වැනි ශ්‍රෙණිය හා 8 වැනි ප්‍රමාණය<br>වයස : 1970.10.1 දිනට අවුරුදු 18 ට අඩු විය යුතුය. | සාමාන්‍ය යාන්ත්‍රික දැනීම අංක ගණිතය ‘ සී ’ | … I, II, III, IV යටතේ ඇති විෂයමාලා අනුරාධපුර දබල්ල, ගාල්ල, මහනුවර, කෑගල්ල, කුරුණෑගල යන කණිෂ්ඨ කාර්මික ආයතනවල හා මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ සිංහල මාධ්‍යයෙන්ද, යාපනයේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ දෙමළ මාධ්‍යයෙන්ද පවත්වනු ලැබේ. අංක V යටතේ ඇති පාඨමාලාව අනුරාධපුර, කුරුණෑගල හා රත්මලාන යන කණිෂ්ඨ කාර්මික ආයතනවල සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.<br>අංක II, III, IV, VI, VII, VIII හා IX යන පාඨමාලා රත්මලානේ කණිෂ්ඨ කාර්මික ආයතනයේ සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අංක X යටතේ ඇති පාඨමාලාව මරදානේ ලංකා කාර්මික විද්‍යාලයේ සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. |

| පාඨමාලාව අංකය (1) | පාඨමාලාවේ නම (2) | අවශ්‍ය සුදුසුකම් (4) | ප්‍රවේශ විභාගයේදී ගතයුතු විෂයයන් (5) | පැවැත් වෙන ස්ථාන (ඉගැන්වීමේ මාධ්‍ය සමග) (6) |
|---|---|---|---|---|
| 29. ජලනළ සවිකිරීම ... | ... අර්ධකාල—සන්ධ්‍යා—එක් අවුරුදු (මෙම වෘත්තියේ නියුක්තවූවන්ට පමණි) ... | 8 වැනි ශ්‍රෙණිය හෝ 8 වැනි ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය. (රජයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්තවූවන් සඳහා මෙම අවශ්‍යතම ලිහිල් කරනු ලැබේ) වයස : 1970.10.1 දිනට අවුරුදු 17 ට අඩු නොවිය යුතුය | (1) සාමාන්‍ය යාන්ත්‍රික දැනීම ... (2) අංක ගණිතය '' සී '' | ... මරදනේ, ලංකා කාර්මික විද්‍යාලයය (සිංහළ), අනුරාධපුරයේ (සිංහල), යාපනයේ (දෙමළ), කුරුණෑගල (සිංහල), මහනුවර (සිංහල), බදුල්ල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතනය. |
| 30. ඔරලෝසු අළුත්වැඩියා කිරීම ... | එම ... | එම ... | එම | ... මහනුවර, කණිෂ්ඨ කාර්මික ආයතනය (සිංහල) |
| 31. ගුවන්විදුලි යන්ත්‍ර සේවා කිරීම ... | එම ... | එම ... | එම | ... මරදනේ ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල), අනුරාධපුරයේ (සිංහල), යාපනයේ (දෙමළ), කුරුණෑගල (සිංහල), සහ මහනුවර (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 32. විදුලි කම්බි ඇදීම ... | ... අර්ධකාල—සන්ධ්‍යා—එක් අවුරුදු (මෙම වෘත්තියේ නියුක්තවූවන්ට පමණි) ... | 8 වැනි ශ්‍රෙණිය හෝ 8 වැනි ප්‍රමාණය හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය. (රජයේ හෝ පාලත් පාලන සේවයේ නියුක්තවූවන් සඳහා මෙම අවශ්‍යකම ලිහිල් කළ හැකිය) වයස : 1079.10.1 දිනට අවුරුදු 17ට අඩු නො විය යුතුය | (1) සාමාන්‍ය යාන්ත්‍රික දැනීම ... (2) අංක ගණිතය '' සී '' | ... මරදනේ ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල), අනුරාධපුරයේ (සිංහල), බදුල්ලේ (සිංහල), ගාල්ලේ (සිංහල), යාපනයේ (දෙමළ), මහනුවර (සිංහල), කෑගල්ලේ (සිංහල), සහ කුරුණෑගල (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතන. |
| 33. වර්ණ යෝජනය ... | ... අර්ධකාල—සන්ධ්‍යා—තුන් අවුරුදු (මෙම වෘත්තියේ නියුක්තවූවන්ට පමණි) ... | එම ... | එම | ... මරදනේ, ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල) |
| 34. ලෙටර් ප්‍රෙස් මැෂින් වැඩ ... | එම ... | එම ... | එම | ... එම |
| 35. පොත් බැඳීම ... | ... එම ... | එම ... | එම | ... එම |
| 36. වඩු සටහන් ඇඳීම ... | ... එම ... | එම ... | එම | ... මරදනේ, ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල), අනුරාධපුරේ (සිංහල), මහනුවර (සිංහල), කුරුණෑගල (සිංහල), ගාල්ලේ (සිංහල), බදුල්ල (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතන |
| 37. හේත්තු වැද්දීම ... | ... එම ... | එම ... | එම | ... මරදනේ, ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල), යාපනයේ (දෙමළ), කුරුණෑගල (සිංහල), සහ මහනුවර (සිංහල) කණිෂ්ඨ කාර්මික ආයතන |
| 38. යන්ත්‍රහල් පුහුණුව | ... එම ... | එම ... | එම | ... මරදනේ ලංකා කාර්මික විද්‍යාලයය (සිංහල), යාපනයේ (දෙමළ), මහනුවර (සිංහල), සහ කුරුණෑගල (සිංහල), කණිෂ්ඨ කාර්මික ආයතන |

12–1245—1969.12.26 දින 14,886 දරණ ගැසට්පත්‍රය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රසායනාගාර සහායකයින් බඳවා ගැනීම පිණිස පැවැත්වෙන විභාගය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රසායනාගාර සහායකයින් බඳවා ගැනීම පිණිස විභාගයක් 1970 මාර්තු මස 14 වැනි දින කොළඹ දී පැවැත්වේ. මෙම තනතුරු සඳහා තරඟ කළ හැක්කේ පිරිමි අපේක්ෂකයින්ට පමණකි. මෙම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, වැටුප් විස්තර ආදිය පහත පළවේ.

**තනතුරට අදාළ වැටුප් පරිමාණය.**—(අ) I ශ්‍රේණිය—අවුරුද්දට රු. 5,304—8×144—6,456 ඒකාබද්ධ වැටුපක්.

(ආ) II ශ්‍රේණිය—අවුරුද්දට රු. 3,144—15×144—5,304 ඒකාබඬ වැටුපක්. (රු. 3,720 ට සහ රු. 4,584 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්.)

(ඇ) III ශ්‍රේණිය—අවුරුද්දට රු. 2,760—4×60 සහ 17×90—4,530 ඒකාබද්ධ වැටුපක්. (රු. 3,360 ට සහ රු. 3,720 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්.)

**සංලක්ෂය.**—කවර අවස්ථාවකදීවත් I ශ්‍රේණියේ පත්වීම් සංඛ්‍යාව II ශ්‍රේණියේ පත්වීම් සංඛ්‍යාවේ හයෙන් එක් කොටසකට වඩා අධික නොවනු ඇත. I ශ්‍රේණියට පත්වීම් කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත තෝරා ගන්නා II ශ්‍රේණියේ නිලධරයන් අතුරෙනි. III ශ්‍රේණියට පත්වීම් කරනු ලබන්නේ රසායනාගාර උප සහායක ශ්‍රේණියෙනි.

2. **සේවා කොන්දේසි.**—(i) මෙම තනතුරු වූ කලී විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරුය. තෝරා ගන්නා පිරිමි අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වනු ඇත.

(ii) තෝරාගනු ලබන අපේක්ෂකයන් දෑවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතුය. පළමුවන අවුරුද්ද කෘෂිකර්මයේ මූල ධර්ම, සත්ව පාලනය හා පශු විද්‍යාව, කෘෂිකාර්මික රසායන විද්‍යාව, කෘෂිකාර්මික උද්භිද විද්‍යාව, කීට විද්‍යාව හා පැළෑටි රෝග නිදාන විද්‍යාව යන මේවායේ තෝරාගත් අංශයක් පිළිබඳ දේශනයන්ට හා ප්‍රායෝගික කටයුතුවලට සීමාවේ. පළමුවන අවුරුද්ද අවසානයේ දී පරීක්ෂණයක් පැවැත්වේ. මෙයින් අසමත් වන අපේක්ෂකයන් අස්කර දැමීමට යටත් වන නමුදු එයින් සමත්වීම් වස් උපරිම වශයෙන් තවත් තුන් වරක් උත්සාහ කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. දෙවන අවුරුද්ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ අංශ වන උද්භිද විද්‍යා, කෘෂිකාර්මික රසායන විද්‍යා, පැළෑටි රෝග නිදාන විද්‍යා, කීට විද්‍යා හා පශු විද්‍යා යන මේවායින් එක් අංශයක ප්‍රධානියා යටතේ ගත කරන අන්තේවාසික කාලයක් වේ. අන්තේවාසික පුහුණු කාලය තුළදී වැඩ සහ හැසිරීම් අසතුටුදායක වන අපේක්ෂකයෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් තීරණය කෙරෙන පරිදි සේවය නවත්නු ලැබීමට හෝ අවුරුද්දකට නොවැඩි කාලයකින් අන්තේවාසික කාලය දීර්ඝ කරනු ලැබීමට හෝ යටත් වෙති. දෑවුරුදු පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලය මත II ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් වශයෙන් පත් කරනු ලැබේ.

(iii) අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨතාවය තීරණය කරනු ලබන්නේ පළමු වන වර්ෂය අවසානයේදී පැවැත්වෙන විභාගයේ ප්‍රතිඵල අනුවය. අන්තේවාසික කාලය දීර්ඝ කරනු ලැබූ අයදුම්කරුවන් සෙසු අයට වඩා කණිෂ්ඨ තත්ත්වයක් දරනු ඇත.

(iv) පුහුණුවන කාලය තුළ දී වසරකට රු. 900 බැගින් වූ දීමනාවක් ගෙවනු ලැබේ. මෙම දීමනාව මත ගෙවල් කුලී දීමනාව හැර ජීවන වියදම් දීමනාව සහ විශේෂ ජීවනාධාර ගෙවනු ලැබේ. පුහුණුව දීර්ඝ කරනු ලැබූ කාලය තුල කවරාකාර දීමනාවක් හෝ නොගෙවනු ලැබේ.

(v) පුහුණුව සඳහා ඇතුළත් කරනු ලබන අයදුම්කරුවන් විසින් පුහුණුවීමේ පංතියට ඇතුළත් වූ දින සිට සත් අවුරුදු කාලයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් එසේ නැත හොත් පුහුණු කාලය තුළදී ලැබූ වැටුප සහ සියලුම දීමනා ආපසු ගෙවන බවටත් ඇපකරුවන් සහිත ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(vi) රසායනාගාර උප සහායක සහ III ශ්‍රේණියේ රසායනාගාර සහායක යන ශ්‍රේණිවලින් බඳවාගන්නා අය පුහුණුවීමේ කාලය තුල වැඩ බැලීමට පත් කරනු ලැබ මෙහි ඉහත (II) වන ඡේදයෙහි සඳහන් විභාගයෙන් සමත් වූ විට ඔවුන්ගේ පත්වීම ස්ථිර කරනු ලැබේ. විභාගයෙන් අසමත් වුවහොත් ඔවුන්ගේ මුල් තනතුරු වලටම ඔවුන් ආපසු යවන්නට සිදුවනු ඇත.

(vii) රසායනාගාර සහායකයින් දින 7 සේවකයන් වන බැවින් රජයේ නිවාඩු දිනයන් හා පෝය දිනයන් ඇතුළුව සතියේ දින 7 තුළදීම සේවය කළ යුතුය. සතියේ සත් දින තුළ දිවා හෝ රෑ ඕනෑම වේලාවක සේවයට කැඳවුවහොත් එසේ පැමිණීමට සූදානම්ව සිටිය යුතුය. දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමටද ඔවුන් සූදානමින් සිටිය යුතුය.

(viii) තෝරා පත්කර ගත් අපේක්ෂකයෝ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිසද විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙදීම පිණිසද දැනට පනවා ඇති හෝ මින් මතුවට පනවනු ලබන කිසියම් ව්‍යවස්ථාවන් වෙතොත් ඒවාට අනුවද ක්‍රියා කළ යුත්තාහ.

(ix) එසේ තෝරාගත් අපේක්ෂකයෝ ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා කාලය තුළදී සිංහල භාෂාවෙහි ප්‍රවීණත්වයක් ලබාගත යුත්තාහ. ආධුනික/පරීක්ෂා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම ස්ථිර කරනු ලබන්නේ අනිකුත් කරුණු ඇතුලු සිංහල ප්‍රවීණතා විභාගයෙන් සමත්වීමෙන් පසුවය.

(x) ආධුනික/පරීක්ෂා කාලය තුලදී සිංහල භාෂා විෂයෙහි නියමිත ප්‍රවීණත්වය ලබා ගැනීමට අපොහොසත් වූවන්ගේ සේවය නවතා ලීමට ඉඩ තිබේ.

((xi) රජයේ සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ඇති නිලධරයන් සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

**සංලක්ෂය.**—(අ) රසායනාගාර සහායක සේවයට පත්කර ගන්නා අවස්ථාවේදී ආදී ප්‍රවේශකයන් වශයෙන් සැලකෙන අය මේ (IX) සහ (X) යන අනුඡේදවල අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) 1956.9.24 දිනට පෙර දිනක සිට ස්ථිර පත්වීම් දරන රසායනාගාර උප සහායකයින් සහ III ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් II ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් වශයෙන් පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ අය රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උදෙසා ආදී ප්‍රවේශකයන් වශයෙන් සැලකේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) හැම අයදුම්කරුවකු විසින්ම තමා වෙත පහත සඳහන් සුදුසුකම් ඇති බව ඔප්පු කළ යුතුය.

(අ) 1970.3.14 දිනට වයස අවුරුදු 17 ට නොඅඩු බව සහ අවුරුදු 25 ට නොවැඩි බව (පහත (ආ) (II) හා (IV) ඡේදයේ අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(ආ) (i) භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිකර්ම යන විෂයයන්ගෙන් එකකිනුත් රසායන විද්‍යා වෙනුත් සම්මාන සහිතව කවර විටක හෝ ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සමත්ව තිබීමත් සමගම ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව තිබීම;

නැතහොත්,

(ii) 1. සිංහල හෝ දෙමළ භාෂාව, 2. අංක ගණිතය, ගණිතය හෝ වානිජ අංක ගණිතය, 3. රසායන විද්‍යාව (සම්මාන) 4. භෞතික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය යන විෂයයන් එකකින් සම්මාන සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය) තිබීම.

සැ. යු.—1, 2 විෂයයන් සහිත විෂයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) සහතික ලබා ඇත්නම් වෙනම විභාගවලදී වුවත් 3 සහ 4 ලබා තිබීම සෑහේ;

නැතහොත්

(iii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියුක්ත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී ඇත්තා වූද, එක ශ්‍රේණියක අවුරුදු 3 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇත්තාවූද, රසායනාගාර උප සහායකයන් සහ III ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් වීම;

නැතහොත්

(iv) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි නියුක්ත කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී ඇත්තා වූද, එක ශ්‍රේණියක අවුරුදු 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකොට ඇත්තාවූද III ශ්‍රේණියේ රසායනාගාර සහායකයන් හෝ රසායනාගාර උප සහායකයකු වීම.

5. **විභාග මාධ්‍යය.**—අයදුම්කරුවන් මෙම විභාගයට සුදුස්සන් වීම සඳහා සමත්ව විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) මේ විභාගයටද පෙනී සිටිය යුතුය. එසේ වුවද—

(අ) විභාගයට ඇතුළත් වීමට සුදුස්සකුවීම පිණිස සමත්වී ඇති විභාගයේදී ඒ ඒ විෂයයන් භාෂා මාධ්‍ය කීපයකින් පෙනී සිට ඇත්නම් මෙම විභාගයේදීද ඒ ඒ විෂයයන්ට ඒ ඒ භාෂා මාධ්‍යයෙන් හෝ පිළිතුරු සැපයිය හැකිය. ඒ හැරුණු විට අන් විෂයයන්ට භාෂාව හා රචනයට (1 වන පත්‍රයට) පිළිතුරු සපයන භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් ගැන නොසලකා මෙම විභාගයට පෙනී සිටීමට අවසර ලැබුවාවූද 4 වැනි ඡේදයේ සඳහන් යෝග්‍යතා විභාගයෙන් සමත්වී නැත්තාවූද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කරන අයදුම්කරුවන් තම තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) අධ්‍යාපන සුදුසුකම් ලැබූ විභාගයට දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පෙනී සිටි අයටද දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ අධ්‍යාපනය ලැබූ අයටද කැමති නම් මේ විභාගයට සිංහල මාධ්‍යයෙන් පෙනී සිටිය හැකිය.

6. ලිඛිත විභාගයේදී සතුටුදායක තත්ත්වයකට එළඹෙන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් වෙත යථා කාලයේදී දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පිළිබඳ දැනුම් දීම එක් එක් අයදුම්කරුවන්ට වෙන් වෙන් වශයෙන් කෙරේ. කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් මෙම සම්මුඛ පරීක්ෂණ මෙහෙයැවේ. මේ සම්බන්ධයෙන් ගමන් ගාස්තු හෝ වෙනත් වියදම් ගෙවනු නොලැබේ.

7. අයදුම්කරුවන්ගේ අවධානය මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළවී ඇති රජයේ සේවයේ පත්වීම් වලට අදාල වන පොදු කොන්දේසි කෙරෙහිද යොමු කරවනු ලැබේ.

8. **අයදුම්පත්.**—(i) මේ විභාගය සඳහා වූ ආදර්ශ අයදුම්පත් පෝර්මයන් මේ නිවේදනය අග පළ කර ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් ඊට අනුව ප්‍රුලුස්කැප් ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙලකර ගත යුතුයි. අයදුම්පතේ 8 වැනි කොටුව එහි පසුපිටේ විය යුතුය.

(ii) අයදුම්පත් 1969 ජනවාරි මස 17 දිනට හෝ ඊට පෙර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), මධ්‍යම කෘෂිකර්ම පර්යේෂණායතනය, ගන්නොරුව, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාරගනු නොලැබේ. අයදුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ, වම් පස කෙළවරේ විභාගයේ නම පැහැදිළිව සඳහන් කළ යුතුය.

(iii) නියමානුකූලව අවලංගු කළ රුපියල් 25 ක මුද්දර අයදුම් පතෙහි අලවා තිබිය යුතුය.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයන් විසින් එවනු ලබන අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. 1969 ජනවාරි මස 17 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂන) වෙත ලැබෙන පරිදි, යවන ලෙස ඉල්ලීමකුත් සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

කෘෂිකර්ම අධ්‍යක්ෂගේ හෝ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට අයදුම්පත් නොඑවිය යුතුය.

(v) අයදුම්කරුගේ අත්සන් සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනෙකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් බාර පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

9. **විභායට ඇතුලත් කර ගැනීම.**—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලක නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

ඉල්ලුම්කරුවන් තමන් සඳහා නියමකර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවකදී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගයට නියමිත කාල සටහන මෙහි පළ කොට ඇති බැවින් වෙනම කාල සටහනක් අයදුම්කරුවන්ට නිකුත් කරනු නොලැබේ.

සියලුම විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළවේ. අපේක්ෂකයා මෙම ව්‍යවස්ථා වන් පිළිපැදීමට බැඳී සිටිති.

යම්කිසි ඉල්ලුම්කරුවකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඔහු විසින් ඒ බව වහාම—නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), මධ්‍යම කෘෂිකර්ම පර්යේෂණායතනය, ගන්නෝරුව, පේරාදෙණිය යන ලිපිනයට දැනුම් දිය යුතුයි. (විදුලි පණිවුඩ යවන ලිපිනය "ඇග්‍රිසර්ච් ගන්නොරුව, පේරාදෙණිය", ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණට දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුය.

(1) විභාගයේ නම :————.

(2) සම්පූර්ණ නම :————.

(3) සම්පූර්ණ ලිපිනය :————.

(4) විභාග මධ්‍යස්ථානය :————.

(5) තැපැල් කන්තෝරුව, ලියාපදිංචි කළ අංකය සහ අයදුම්පත තැපැල් කළ දිනය :————.

(ii) විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුයි.

කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස අවසර දිය හැකිය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

10. **හැඳින්වීමේ පත්‍ර.**—විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු විසින් ම විභාග ශාලාවේදී විභාග පරිපාලකගේ සතුටට හේතුවන පරිදි සෑම විෂයයක් පාසාම ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් ඕනෑම එකක් භාරගනු ලැබේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්,

(ආ) විභාග දිනයට අවුරුදු 3කට නොවැඩි කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රය),

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක්ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

(ඈ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටේ දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්.
පසු පිටෙහි සඳහන් ඡායාරූපයෙහි මෙහි අත්සන් කර ඇති........................ (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අයගේ බව සහතික කරමි.

.........................................
අයදුම්කරුගේ අත්සන.

.........................................
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

.........................................
(නම සහ තරාතිරම)

දිනය :..............................

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි ඉල්ලුම්කරුවකුගේ අපේක්ෂකත්වය තාවකාලිකය. එම අපේක්ෂකත්වය කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) අයදුම්පත්‍ර සමග වෙන කිසිම ලිපි ලේඛනාදියක් නොඑවිය යුතුය. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන සියලුම කරුණුවලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් සලකා බලා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයන් විසින් තමන්ගේ යෝග්‍යතාව ලියකියවිලිවලින් ඔප්පු කළ යුතුය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවහොත් එම අවස්ථාවේදී ඉදිරිපත් කිරීම හෝ නොඑසේ නම් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපැලෙන් යැවීම හෝ කළ යුතුය.

(iii) පහත දැක්වෙන ලියකියවිලි අවශ්‍ය විය හැකිය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතික තුනක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ උපකෘත පාඨශාලාවකින් ළඟදී අස්වී හෝ සිටීනම් චරිත සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. නොඑසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥ කෙනෙක්, නීතිඥ කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 4,800ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකටව දන්නා, කෙළින්ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරෙකුගෙන් වුවද ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම හා ලිපිනය ද එහි පැහැදිලි සේ සඳහන්ව තිබිය යුතුය.

ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ උප්පැන්නය ලියාපදිංචි නොකළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් අවශ්‍යය. කිසියම් අපේක්ෂකයකු හට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනය.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බවුතීස්ම පත්‍ර භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේදී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න **හා මරණ ලියාපදිංචි කිරීමේ** ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්න යෙන් දැක්වෙන නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

(iv) 1957 අගෝස්තු මස 18 වනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ ප්‍රකාර ස්වකීය නම වෙනස් කළ දැනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචිවීමේ සහතික පත්‍රයේ හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දැක්වෙන සහතිකයක් (උචිත වන පරිදි).

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදාල වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (**උදාහරණය**—පෞද්ගලික අපේක්ෂක යන් වෙත නිකුත් කරන ලද (ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂක යාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්).

(ඉ) හේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය.

(ඊ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා මෙය රැගෙන ආයුතුය.).

(v) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමනා සියළුම ලියකිය විලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ අවස්ථාවේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. **මුදල් ආපසු ගෙවීම.**—කිසිම කරුණක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය වෙනුවෙන් ගෙවන ලද ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කළ හැකි නොවේ.

13. **විභාග පරිපාටිය.**—විභාග සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දැක්වේ. නරක අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ :—

| | | ලකුණු |
|---|---|---|
| (i) | භාෂාව හා රචනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (පැය 1යි)... | 50 |
| (ii) | රසායන විද්‍යාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (පැය 2යි) ... | 100 |
| (iii) | භෞතික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (පැය 1යි) ... ... | 50 |
| (iv) | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (පැය 1/2යි) ... ... | 50 |

මෙම විභාගයට නියමිත විෂය නිර්දේශය අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයට මෙනි.

14. **කාල සටහන.**—මෙම විභාගයට නියමිත කාල සටහන මෙසේය. වෙනම කාල සටහනක් නිකුත් නොකරන බැවින් මේය පිටපත් කර තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

**1970 මාර්තු මස 14 දින**

පෙරවරු 9—10 දක්වා—භාෂාව හා රචනය.

පෙරවරු 10.15—11.15 දක්වා—භෞතික විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හෝ සත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂිකර්මය.

පෙරවරු 11.30—දවල් 12 දක්වා—සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය.

පස්වරු 1—පස්වරු 3 දක්වා—රසායන විද්‍යාව.

15. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය එසේ නැතහොත්, ඔහු මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බව ඔහුගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත් ඔහු වහා සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

ඇම්. ඇස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 14 වැනි දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

**රසායනාගාර සහායකයින් බඳවා ගැනීම—කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

විභාග අංකය :————.

1. මුලකුරු සමග අගට යෙදෙන නම :————.

2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

3. සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින අපේක්ෂක යින් කාර්යාලීය ලිපිනය සඳහන් කළ යුතුය) :————.

4. සුදුසුකම් :—

(අ) උපන් දිනය :————.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් :————.

(ඇ) ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි වීමෙන්ද යන වග :————.

(ඈ) විභාගයට පෙනී සිටීමට ඔබේ ඇති සුදුසුකම් පිළිබඳ අනිකුත් විස්තර :————.

5. විභාගයේදී ඔබ පෙනී සිටින විෂයයන් :————.

| | විෂයය | මාධ්‍යය |
|---|---|---|
| (1) | භාෂාව හා රචනය | ......................... |
| (2) | රසායන විද්‍යාව | ......................... |
| (3) | සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය | ......................... |
| (4) | | ......................... |

6. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නොකරන ලද වලංගු මුද්දර බවත්, මෙයින් දිවුරා සහතික කරමි.

(ii) මෙම විභාගය පිළිබඳ නීතිරීතිවලට යටත්වීමට එකඟ වෙමි.

7. **මුද්දර කොටුව :**

**සැළකිය යුතුයි.**—විභාගාපේක්ෂකයා රුපියල් විසිපහක් වටිනා මුද්දර මෙම කොටුවෙහි අලවා ඒ උඩ අත්සන සහ දිනය යොදා අවලංගු කළ යුතුය. මුද්දර එකපිට ඇලවිය යුතු නොවේ.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

..............සේවයේ නියුක්ත/පදිංචි................නමැති අය පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 19.........මස..... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————.

නම, පදවිය හා තරාතිරම :————.

ලිපිනය :————.

දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළයුත්තේ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි.

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපෙක්ෂයන් සඳහා නීති

සියලුම විභාගාපෙක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපෙක්ෂක යකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපෙක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකියයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගා පෙක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපෙක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපෙක්ෂයන් විභාග ශාලාව තුලදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගා පෙක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත්, පෙරත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපෙක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධි පතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගා පෙක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපෙක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපෙක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපෙක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලා ධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභාගාපෙක්ෂකයෙකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපෙක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර නින්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ පිණිස නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නවා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපාහැරිය යුතුයි.) විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍රකර්ම යෙහිදී තමන්ගේ චිත්‍රය තවත් අපෙක්ෂකයෙකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම්ය. මේ සියලුම ද විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත් පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කෑබැලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදියද, ෆයිල් කවර, කාඩ් බෝඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තබා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපෙක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගාශාලාධිපති නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීමද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම්ය. තවත් අපෙක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු ලබා ගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වගකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණවූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුයි.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපෙක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපෙක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතීන්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත්, ඔහු සෝදිසියකට භාජනය විය යුතුයි.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතිතැනට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පෙවන කඩදාසි ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුනොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාගශාලාවේදී ඔබටම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වනසේ ඔබගේ ලියන මේසය මත තබාගන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන් ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හිස්ව තබන්න. ලියන හැම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවලට අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින්, එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවලට අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නයන්වලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුනා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතුකරනතුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූ වකුසේ සලකනු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍යවූ විටද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුයි.

කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

12-1224—69.12.23 වැනි අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/23/21/8 (ජී)

## භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ විභාගය—1970 ජනවාරි

1969.12.12 දින අංක 14,884 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉහත සඳහන් විභාගය පිළිබඳ 1969.12.4 දින දරණ නිවේදනයේ 8 වැනි ඡේදයේ සඳහන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 1970 ජනවාරි මස 10 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව අපේක්ෂකයින්ගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

12-1580—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

ජාතික පුස්ත... ලේ හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය " ටෙන්ඩර් " මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 300 ක් බෝලවත්ත හෝ ලුනුවිල දුම්රිය අංගනයකට සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර 1970 ජනවාරි මස 23 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රු. 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1970 ජනවාරි 9 වැනි සිකුරාදා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගතහැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතෝ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරුතැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370, කොළඹ,
1969.12.17 වැනි දින.

12–1104—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය " ටෙන්ඩර් " මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 500 ක් බංගදෙණිය, බත්තුලුඔය හෝ මුන්දලම දුම්රිය අංගනයකට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 ජනවාරි මස 23 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රු. 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරුතැන වෙත 1970 ජනවාරි 9 වැනි සිකුරාදා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගතහැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතෝ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරුතැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370, කොළඹ,
1969.12.17 වැනි දින.

12–1103—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### පදවිය උප කොටස

පදවිය උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් අනුරාධපුර උතුරු මැද කොටස භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජනවාරි 24 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවෙලේම කරනු ලැබේ.

| ටෙන්ඩර් අංක | වැඩ විස්තරය | කොන්ත්‍රාත් කරුවකු වශයෙන් ලියාපදිංචි මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. | රු. |
| පී.එස්. 8 | පදවිය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරයේ ''ඊ'' යායේ කාර්මික සහකාර මහතුන්ගේ නිවාසයක් ඉදි කිරීම | 50,000 | 50 |
| පී.එස්. 9... | පදවිය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපාරයේ 12 වෙනි යායේ කාර්මික සහකාර මහතුන්ගේ නිවාසයක් ඉදි කිරීම | 50,000 | 50 |
| පී.එස්. 10... | පදවිය ව්‍යාපාරයේ දකුණු ඉවුර ප්‍රධාන ඇලේ 5 සැතපුමේ 40 දම්වැලේ වානක් ඉදි කිරීම | 25,000 | 25 |

ඉහත සඳහන් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිති වලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට මේ සඳහා ඉල්ලුම් කළ හැක. මෙම ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ 1970 ජනවාරි 10 දින පෙරවරු 10 සිට 1970 ජනවාරි 20 දින දහවල් 12 දක්වා පදවිය/මහකනදරාව/අනුරාධපුර, වාරිමාර්ග කායඞාල වලිනි. නියමිත ටෙන්ඩර තැන්පත් මුදල ඕනෑම කච්චේරියක හෝ ඉහත සඳහන් කළ වාරිමාර්ග ඉංජිනේරු කායඞාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් එකී වාරිමාර්ග කායඞාලයකින් ටෙන්ඩර් පත් ලබා ගත හැක. මෙසේ ටෙන්ඩර් පත් ලබාගැනීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් කරුවන් තම තමන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් රජය යටතේ කරන වැඩ හා ඒවායේ වටිනාකම සඳහන් ප්‍රකාශයක්ද ඔවුන්ට ඉල්ලුම් කිරීමට හැකිද යන්න තීරණය කිරීම සඳහා ටෙන්ඩර් ලබාගන්නා කායඞාලයට ඉදිරිපත් කළ යුතු වන්නේය. ටෙන්ඩර් පත් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම අදාල වැඩයේ නම ටෙන්ඩර් පත් බහා ඇති කවරයේ වම් පස උඩ කෙළවරේ පැහැදිළිව සඳහන් කළ යුතුය.

මේ සඳහා අවශ්‍ය වෙනත් විස්තර පදවිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඞාලයෙන් රාජකාරි වේලාවන් තුළදී ලබාගත හැක.

කේ. ඇම්. ඒ. පී. සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
පදවිය උප කොටස.

1969 දෙසැම්බර් මස 14 දින,
පදවිය වාරිමාර්ග කායඞාලයේදීය.

12–1146—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මිළ ගණන් කැඳවීම් පත් අංකය : එල් කිව්/ඩී.ඊ.වී. 900/1

පහත දක්වා ඇති විස්තර අයුරු පැරකොට් ගැළුම් 400 ක් සැපයීම සඳහා පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පෙරවරු 10.30 තෙක් මිළ ගණන් භාර ගනු ලැබේ.

පැරකොට් ගැළුම් 400 කා සැපයීම සඳහා (විශේෂ විස්තර සඳහා මෙම දැන්වීමේ ඉංග්‍රීසි අනුවාදය බලන්න.)

2. මිළ ගණන් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ " පැරකොට් ගැළුම් 400 ක් සැපයීම සඳහා මිල ගණන් පත් අංක එල් කිව්/ඩී.ඊ.වී. 900/1 " යන්න සඳහන් කර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත මිළ ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිළ දැක්විය යුත්තේ :—

ගබඩාවෙන් ලබා ගැනීම සඳහාය.

4. පිළිගත් ටෙන්ඩර්කරු තමා ගේ මිල ගණන් භාර ගෙන ඇති බවට දන්වා එවන ලිපියේ දින සිට සති දෙකක් ඇතුලත එම ද්‍රව්‍ය භාර දීම කල යුතුයි.

5. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම මිළ කැඳවීමක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම මිළ කැඳවීමකින් කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

12–1112—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පේරාදෙණිය, ගන්නොරුවේ ප්‍රධාන වැඩපලට හා කුණ්ඩසාලේ ජල නල ව්‍යාපාරයට ගොඩනැගිලි උපකරණ සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර්

මෙහි පහත සඳහන් ගොඩනැගිලි උපකරණ, සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පේරාදෙණිය, ගන්නොරුවේ ඉංජිනේරු අංශයේ, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජනවාරි මස 17 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

**(අ) කෘෂිකර්ම යාන්ත්‍රික වැඩපල, ගන්නොරුව, පේරාදෙණිය**

| | |
|---|---|
| (1) කළු ගල් 6″ සිට 9″ | කියුබ් 15 |
| (2) කළු ගල් 4″ සිට 6″ | කියුබ් 55 |
| (3) මැටල් 2″ | කියුබ් 30 |
| (4) වැලි | කියුබ් 25 |

**(ආ) ජලනල ව්‍යාපාරය, කුණ්ඩසාලේ**

| | |
|---|---|
| (1) කළුගල් 6″ සිට 9″ | කියුබ් 20 |
| (2) කළුගල් 4″ සිට 6″ | කියුබ් 25 |
| (3) මැටල් 2″ | කියුබ් 8 |
| (4) මැටල් ¾″ | කියුබ් 5 |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියම තත්ත්වයන් අනුව තිබිය යුතුයි. මෙම උපකරණ 1970 පෙබරවාරි මස 15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. ටෙන්ඩර් කරුවන්ට මෙම කොටස් දෙකෙන්, කොටසකට හෝ කොටස් දෙකටම ටෙන්ඩර් කළ හැකිය.

4. 1970.1.17 දින ප. ව. 2.30 ට පෙර ලැබෙන සේ දෙපිටපතකින් සකස් කරන ලද ටෙන්ඩර් හොඳින් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා, " පේරාදෙණිය, ගන්නොරුවේ ප්‍රධාන වැඩපලට ගොඩනැගිලි උපකරණ සැපයීමට හා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ සඳහන් කර, පේරාදෙණිය, ගන්නොරුවේ, යාන්ත්‍රික අංශයේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන යන ලිපිනයට එවිය යුතුයි.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසන් කරන ලද දිනයේ සිට සති හතරක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුයි.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගන්නොරුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

7. ටෙන්ඩර් සියල්ල එකක් හෝ ඉන් කොටසක් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුයි.

එල්. ආර්. එල්. පෙරේරා,
ප්‍රධාන ඉංජිනේරු.

1969 දෙසැම්බර් මස 15 වැනි දින,
පේරාදෙණිය, ගන්නොරුවේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දීය.

12–1183—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### පාවිච්චියට ගත නොහැකි වාහන විකිණීම

පහත සඳහන් වාහන විකිණීම සඳහා සුරාබදු දෙපාතීමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1970 ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වාහනයේ අංකය | තබා ඇති ස්ථානය |
|---|---|
| බෙඩ්පඩ් වෑන්රථය සීවී 473 ... | සුරාබදු අධිකාරී කාර්යාලය, කළුතර. |
| බෙඩ්පඩ් වෑන්රථය සීවී 475 ... | සුරාබදු අධිකාරී කාර්යාලය, පානදුරය. |
| ලෑන්ඩ් රෝවර් රථය ඊවයි 7989 | රජයේ ස්කාගාරය, සීදූව. |

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර 1970 ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 10.30 ට සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙහිදී විවෘත කරනු ඇත.

3. ටෙන්ඩර් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘතිපත්‍ර 1970 ජනවාරි මස 11 වැනි දින ප. ව. 3 දක්වා සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට පළමු ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් කොළඹ 7හි සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙහි හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ බවට ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

5. සෑම ටෙන්ඩරයක් ම පිටපත් 2 කින් යුක්ත විය යුතුය. ටෙන්ඩර්පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවර " පාවිච්චියට ගතනොහැකි වාහන විකිණීමේ ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කළ යුතුය.

6. ලියාපදිංචිකළ තැපැල් මගින් ද ටෙන්ඩර්පත්‍ර එවිය හැක. කිසියම් ටෙන්ඩර් කරුවෙක් ස්වකීය ටෙන්ඩරය තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයෙහි වැ. බ. සුරාබදු අධිකාරි එල්. ආර්. ගුණරත්න මහතා වෙත භාරදිය හැක. එබඳු අවස්ථාවලදී ඉහත 5 වන ඡේදයෙහි සඳහන් විස්තරද ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ද ටෙන්ඩරය බහා එවන කවරයෙහි සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය සෑම විටම මුද්‍රා තැබිය යුතුය.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1969.12.7.

12—1145—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජනසේවා දෙපාර්තමේන්තුව

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වන නි.මි.යෝ.ක්‍ර. ගබඩාවන්හි සහ රජයේ හාල්මෝලවල දනට ඇති පාවිච්චියට අයෝග්‍ය පරණ ගෝනි මිළදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1970 ජනවාරි 9 වැනි සිකුරාද ප.ව. 2.30 වන තෙක් බාරගනු ලැබේ :—

| | | ගෝනි ප්‍රමාණය |
|---|---|---|
| 1. | රජයේ හාල් මෝල, අම්බලන්තොට ... | 9,019 |
| 2. | හාල්මෝල් වී ගබඩාව, අම්බලන්තොට ... | 4,400 |
| 3. | නි.මි.යෝ.ක්‍ර. ගබඩා අංක 1 අම්බලන්තොට ... | 6,275 |
| 4. | නි.මි.යෝ.ක්‍ර. ගබඩා අංක 2 අම්බලන්තොට ... | 4,050 |
| 5. | නි.මි.යෝ.ක්‍ර. ගබඩා අංක 1 වීරවිල ... | 13,818 |
| 6. | නි.මි.යෝ.ක්‍ර. ගබඩා අංක 2 වීරවිල ... | 1,911 |
| 7. | නි.මි.යෝ.ක්‍ර. ගබඩාව, රන්න ... | 264 |

2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත කාර්යාලයේ නි.මි.යෝ.ක්‍ර. හා වී කෙ. අංශයට රු. 200 ක් තැන්පත් මුදලක් ගෙවන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970.1.9 දින දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් විමසා දනගත හැක.

වි. කි. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969.12.19 දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී ය.

12—1177—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය.

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය ගොඩනැගීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම

මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයක් ගොඩනැගීම සඳහා 1970 ජනවාරි මස 16 වැනි සිකුරාදා, ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 50 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරිට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 15,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලයලත් කොන්ත්‍රාත් කරුවනට පමණක් " කොන්ත්‍රාත් කරුවන්ගේ සටහන් පොත " ඉදිරිපත් කිරීමෙන් 1970 ජනවාරි මස 15 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර් කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිවම එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
අංක 42 දරණ ස්ථානයේ
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

12-1110—69.12.23 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ ලැයිස්තුව

#### කුච්චවෙලි ආදායම් පාලක කොට්ඨාශය

| | වැවේ නම | වැඩෙහි ස්වභාවය | ගො. කා. ස. ප්‍රදේශය |
|---|---|---|---|
| 1. | ඔඩ්ඩන්කුලම් | ඇල සෑදීම | වන්නියාර් වෙලි |
| 2. | කුඩාවැව පරණ මැදවච්චිය | වැඩිදියුණු කිරීම | පරණ මැදවච්චිය |
| 3. | පේරිල්ලාකුලම් | ප්‍රතිසංස්කරණය කිරීම | වාමලන්කුලම් |
| 4. | වාමලන්කුලම් (පුල්මොඩ්ඩෙයි) | වාන ගොඩනැගීම | එම |
| 5. | ඔඩ්වයාල්කුලම් | ප්‍රතිසංස්කරණය කිරීම | මුදලපාලිමඩු |
| 6. | නාරන්කන්කුලම් | එම | වාමලන්කුලම් |
| 7. | මහඇලන්කුලම් | වැව අළුත්වැඩියා කිරීම | කුසවනාර්තුවෙලි |
| 8. | පුලියන්කුලම් | වාන ගොඩනැගීම | පුදුවැලිකුලම් |
| 9. | පරණ මැදවච්චිය | වැඩිදියුණු කිරීම | එම |
| 10. | ඊරමද්දුකුලම් | එම | එම |
| 11. | කල්ලිකඩ්ඩුකුලම් | එම | ආන්දන්කුලම් |
| 12. | කුන්චුකුලම් | එම | පුදුවෙලිකුලම් |
| 13. | පොයිහායිකුලම් | ස්ලුයිස් එක ගොඩනැගීම | කුසවනාර්තුවෙලි |
| 14. | කුසවනාර්තු | අමුණ අළුත්වැඩියා කිරීම | එම |
| 15. | මඩුවකුලම් | කාන්දු වනතැන් ප්‍රතිසංස්කරණය කිරීම | මඩ්ඩුවකුලම් |
| 16. | ඔඩ්ඩුපුල්ලුකුලම් | ප්‍රතිසංස්කරණය කිරීම | වාමලන්කුලම් |
| 17. | වාමලන්කුලම් (නිලාංවෙලි) | ඇළ වැඩිදියුණු කිරීම | මඩ්ඩුවකුලම් |
| 18. | වන්නාදිකුලම් | වැඩිදියුණු කිරීම | එම |
| 19. | මානාන්ඩකුලම් | ඇළ වැඩිදියුණු කිරීම | එම |
| 20. | කුඩපුලියාන්කුලම් | ප්‍රතිසංස්කරණය කිරීම | පුදුවෙලිකුලම් |

### මුතූර් ආදයම් පාලක කොට්ඨාශය

| | වැවේ නම | වැඩෙහි ස්වභාවය | ගො. කා. ස. ප්‍රදේශය |
|---|---|---|---|
| 1. | පුලියන්කුලම් | වැඩිදියුණු කිරීම | කුනතීව් |
| 2. | සිරිආලන්කුලම් | ස්ලූයිස් එක ගොඩනැගීම | සාම්පූර් |
| 3. | සෙමවඩ්ඩුවාන්කුලම් | වැඩිදියුණු කිරීම | නයනාතායි |
| 4. | වේලන්කුලම් | එම | එම |
| 5. | කරාඩිපාලිකුලම් | එම | සාම්පූර් |
| 6. | පෙරියකුලම් | එම | කුනතීව් |
| 7. | පුලිකුදින්නකුලම් | එම | එම |

### කින්නියා ආදයම් පාලක කොට්ඨාශය

| | | | |
|---|---|---|---|
| 1. | මහමාර්කුලම් | වැඩිදියුණු කිරීම | මහමාරම්සල්ලිකලප්පු |

### නගර හා කඩවත් ආදයම් පාලක කොට්ඨාශය

| | | | |
|---|---|---|---|
| 1. | විලන්කුලම් | රෙගියුලේටරය සෑදීම | කන්නියා |

### ගෝමරන්කඩවල ආදයම් පාලක කොට්ඨාශය

| | | | |
|---|---|---|---|
| 1. | සින්නකුලම් | වැඩිදියුණු කිරීම | පනිකැට්මුරිප්පු |
| 2. | දිවුල්වැව | එම | ගෝමරන්කඩවල |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජන්වාරි මස 23 දින දවල් 12 දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචනවලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ '' ........................................................................ සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 ජනවාරි මස 26 දින දවල් 12 ට පෙර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම් ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති '' ටෙන්ඩර් පෙට්ටියට '' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමක් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත්යයි හැගෙන හේතුන් උඩ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරික්ෂා කර බැලීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරික්ෂාකර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 ජනවාරි මස 27 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරික්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

ඒ. ෂන්මුගරාජා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 14 දින දීය.

12–1089—1969.12.26 දින අංක 14,886 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කෑගල්ල ප්‍රදේශයේ පාසැල් වලට කිරි විස්කෝතු ගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම

මෙහි පහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

1. පහත සඳහන් කර ඇති සැපයීම් මධ්‍යස්ථානයන් හි සිට "කොරුගේටඩ් බෝඩ්" (ප්‍රමාණය 13"×11"×9½") පෙට්ටිවල අසුරන ලද විස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන් හි පිහිටි පාසැල් වලට ප්‍රවාහනය කිරීම.

සඳහන් කරන ලද සැපයීම් මධ්‍යස්ථානයන් හා මණ්ඩල මෙසේ ය :—

කෑගල්ල සැපයීම් මධ්‍යස්ථානය—කෑගල්ල හා ගලිගමුව.
කෑගල්ල සැපයීම් මධ්‍යස්ථානය—මාවනැල්ල සහ රඹුක්කන.
වරකාපොල සැපයීම් මධ්‍යස්ථානය—දැදිගම.
කොට්ටාව විස්කෝතු කර්මාන්ත ශාලාව—රුවන්වැල්ල.
කොට්ටාව විස්කෝතු කර්මාන්ත ශාලාව—යටියන්තොට.
කොට්ටාව විස්කෝතු කර්මාන්ත ශාලාව—දෙහිඕවිට.
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—රුවන්වැල්ල.
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—යටියන්තොට.
කරවනැල්ල සැපයීම් මධ්‍යස්ථානය—දෙහිඕවිට.

ඉහත සඳහන් සේවාවන් සඳහා ටෙන්ඩර් පත්‍ර කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1970 ජනවාරි මස 13 වැනි දින පෙරවරු 10.30 තෙක් භාර ගනු ලැබේ.

කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රුපියල් 100 ක තැන්පත් මුදලක් කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත් අයට 1970 ජනවාරි මස 12 වෙනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම්, එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යයය.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාර දීම අපේක්ෂා කරන අයවලුන් විසින් කෑගල්ල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් හා ඉල්ලුම්කරුගේ නමින් ලියා පදිංචි කරන ලද 1969 වර්ෂයට බලපත්‍රයක් ලබාගත් එක් ලොරියක් වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ප්‍රවාහනය කිරීමට අදහස් කරන මණ්ඩලවල ගණන දෙකකට වැඩි නම් ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරු නමින් ලියා පදිංචි කළ ලොරි දෙකක් වත් තිබිය යුතුය. අනුමත කරන ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති, මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින් කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ එකී සමිතියට මෙම සේවය ඉටුකිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු නොලැබේ.

කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ "ඇදිහැස" සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇණවුම්පත් ලැබී සතියක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් භාර දීම කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ එකී කොටස් භාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති 6 ක් කල් දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳව කොන්දේසි හා වෙනත් විස්තර කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි මහතාගෙන් ලබාගත හැකිය.

ඔලිවර් අබේසේකර,
කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969.12.20 දින,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

12–1086—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

### අළුත් ටොන් 8-10 ඩීසල් ලොරි බැඩි 22 ට විවෘත වර්ගයේ ලොරි බොඩි තැනීම

කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් විසින් අළුත් ටොන් 8-10 ඩීසල් ලොරි බැඩි 22 ට විවෘත වර්ගයේ බොඩි තැනීම සඳහා ටෙන්ඩර් 1970 ජනවාරි 17 දින පස්වරු 2.30 දක්වා බාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත මුදලින් රු. 250 ක් තැන්පත් කර 1970 ජනවාරි මස 16 වෙනි දින දහවල් 12 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර අනුව ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය පිළිබඳ සියළුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස්ගෙන් ලබාගත හැකිය.

ඇම්. ඩී. ඩී. පීරිස්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1969.12.17 දින,
කොළඹ 2,
ආහාර කොමසාරිස් කාර්යාලයේදී ය.

12–1103—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### හැකිළිය හැකි දොරවල් 3 ක් හා සිර කාමර ගේට්ටු 6 ක් සැපයීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1970. 1. 9 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1970. 1. 8 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

3. සියලු ටෙන්ඩර් කවරයන් හි වම්පස ඉහළ කෙළවරේ "හැකිළිය හැකි දොරවල් හා සිරකාමර ගේට්ටු සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි කළ තැපැලෙන් හෝ පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන් ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස් වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල් රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1970. 1. 9 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10 වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

සී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
1969. 12. 17,
සීපී/2/399

12–1107—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුව කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 පෙබරවාරි 1 වැනිද සිට 1970 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ චේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වක්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වක්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වක්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, මඩකලපුව '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන් එහි වම් පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

13. රෝගීන්ට සහ සේවකයින්ට ආහාර සැපයීමට අවශ්‍ය සහල් ප්‍රමාණය එක් අයකුගේ සලාකයක පදනම මත කොන්ත්‍රාත්කරුවන් වෙත ඒ ඒ ආයතන භාර නිලධාරීන් මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සතිපතා ලබාගැනීමට අවසර පත් නිකුත් කරනු ඇත.

ඒ. බී. එන්. මොහමඩ්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 දෙසැම්බර් 15 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරිගේ කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණ දළ වශයෙන් — සේවකයින්ට — අළුත් මාළු | සේවකයින්ට — කරවල | සේවකයින්ට — එළවළු | නොගෙවන රෝගීන්ට — අළුත් මාළු | නොගෙවන රෝගීන්ට — කරවල | නොගෙවන රෝගීන්ට — එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | |
| එරාවූර් ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | | 200 | 450 | 900 | 750 | 1,500 | 3,000 |
| පොතුවිල් ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 400 | | 300 | 600 | 1,250 | 900 | 1,850 | 3,750 |
| අක්කරපත්තු ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | | 400 | 700 | 1,550 | 450 | 850 | 1,750 |
| නින්දවූර් ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 300 | 1970.1.24 | 250 | 500 | 1,000 | 100 | 200 | 400 |
| කලුවාන්චිකුඩි ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 300 | පෙ.ව. 10. ට | 50 | 50 | 100 | 550 | 1,100 | 2,200 |
| වාකරේ ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 500 | | 300 | 650 | 1,250 | 350 | 700 | 1,350 |
| ලාහුගල මාතෘ නිවාසය | 100 | 300 | | 200 | 350 | 700 | 350 | 700 | 1,400 |
| නාවත්කාඩු මාතෘ නිවාසය | 100 | 300 | | 200 | 450 | 900 | 100 | 250 | 450 |
| තිරුකෝවිල් මාතෘ නිවාසය | 100 | 300 | | 150 | 300 | 600 | 100 | 150 | 250 |
| අක්කරපත්තු මාතෘ නිවාසය | 100 | 300 | | 100 | 100 | 300 | 150 | 250 | 450 |

12–1127—69.12.26 දින අංක 14,886 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජනවාරි මස 23 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. මහ/අම්පිටිය සිද්ධාර්ථ ම. වි. | පන්ති කාමර අටක පාසල් ගොඩනැගිල්ල |
| 2. මහ/ගිරාගම ගුරු වි. ... | ශිෂ්‍ය නිවාසය |

සංලක්ෂ්‍යය—මහ=මහනුවර ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 රු. 1,00,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 2 රු. 1,75,000 හා ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජනවාරි මස 21 වැනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාතීමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදීයේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩ සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරී වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් විගාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 ජනවාරි මස 23 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘති අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 17 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

12–1164—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—නුවරඑළිය

### පාසැල් ගොඩනැගිලි තැනීම

නුවරඑළිය ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවමින් 1969 දෙසැම්බර් මස 5 වෙනි දින දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ටෙන්ඩර් දැන්වීම පිළිබඳවයි.

2. එහි සඳහන් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීම 1970 ජනවාරි මස 12 වෙනි දින පෙරවරු 12 දක්වා ද, ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම 1970 ජනවාරි මස 13 වෙනි දින පෙරවරු 10.30 දක්වා ද දීර්ඝ කරන ලදි.

ඒ. ජී. ඒ. මැන්දිස්.
අධ්‍යාපන අධ්‍යක්ෂ (කා. නි.),
නුවරඑළිය ප්‍රදේශය.

1969.12.17.

12–1160—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

පහත සඳහන් ස්ථානයන්හි ලිස්ටර් ජෙනරේටිං සෙට් 11 ක් සවිකිරීම සඳහා පොලිස් මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

(1) කොළඹ 1, කොටුවේ නව ලේකම් ගොඩනැගිල්ලේ සහ
(2) පහත සඳහන් පොලිස් ස්ථානවල:—

(ඒ) වවුනියාව
(බී) අම්බලන්ගොඩ
(සී) මොණරාගල
(ඩී) කල්මුනේ
(ඊ) කොම්පඤ්ඤ වීදිය
(ඇෆ්) මරදාන
(ජී) බොරැල්ල
(එච්) පිටකොටුව
(අයි) කොටුව සහ
(ජේ) කුරුණෑවත්ත.

2. කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ කායශීලයේ හෝ ටෙන්ඩර් මුදල් රු. 25 ක් තැන්පත් කිරීමෙන් ලබාගත් රිසිට්පතක් කොළඹ 5, නාරාහේන්පිට පොලිස් කායශීලය වෙත 1970.1.17 දින දහවල් 12 ට පෙර ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

3. එසේ ලබාගත් පෝරම පිටපතකින් යුතුව 1970.1.19 දින පෙරවරු 10 ට පෙර ලැබෙන සේ කොළඹ 1, පොලිස් මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මෙම ටෙන්ඩර් පත් පොලිස් මූලස්ථානයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ, නියමිකරන ලද දිනට හා වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතුයි. එසේත් නැතිනම් මෙම ටෙන්ඩර් පත් කොළඹ 1, පොලිස් මූලස්ථානයේ, මූලස්ථාන පොලිස් අධිකාරී වෙත නියමකරන ලද දිනට හා වේලාවට ප්‍රථම භාරදී ලැබුණු බවට රිසිට් පතක් ලබාගත යුතුයි.

4. 1970.1.19 දින පෙරවරු 10 ට ඉහත සඳහන් කායශීලයේදී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණීමට අවසර දෙනු ලැබේ.

5. වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ කායශීලයෙන් ලබාගත හැක.

ජී. ජයසිංහ,
පොලිස් අධිකාරී, ප්‍රවාහණ.

පොලිස් ප්‍රවාහණ කායශීලය,
නාරාහේන්පිට,
කොළඹ 5,
1969.12.14 දින.

12–1141—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : ඇල්. ඩබ්ලිව්/1/63

## පුත්තලම කච්චේරිය

රු. 25,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි සඳහන් තැනීම් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 ජනවාරි මස 19 වැනි දින සවස 2.30 දක්වා කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

වැලිපැලැස් ස-අඩිප් පොල ව්‍යාපාරයේ සැතපුම් දෙකක් වූ පාරේ පෙට්ටි බෝක්කු 13 ක් තැනීම.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි, පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී වැඩය සඳහා පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී වැඩය සඳහා රු. 50 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබා ගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබා ගත හැකිය. එම ටෙන්ඩර් ආකෘතිපත් 1970 ජනවාරි මස 18 වනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, කොළඹ මහා භාණ්ඩාගාරයේ තුන්වැනි මහලේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තැ. පෙ. 500, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 දෙසැම්බර් මස 15 දින,
පුත්තලම කච්චේරියේ දී ය.

12-1140—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## " 1969. 12. 5 දින ගැසට් පත්‍රයේ පළකරන ලද ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කොළඹ දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ සඳහාවූ ටෙන්ඩර් දැන්වීමේ කාලය දීර්ඝ කිරීම "

1969. 12. 5 දින අංක 14,883 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කොළඹ දිස්ත්‍රික්කයේ සුළු වාරිමාර්ග වැඩ සඳහාවූ ටෙන්ඩර් දැන්වීමේ සඳහන් කාල සීමාවන් මෙහි පහත සඳහන් අයුරු දීර්ඝ කරන ලද බව මෙම කායඝාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් වෙත හා විවිධ සේවා සමූපකාර සමිති ග්‍රාම සංවර්ධන සමිති වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ :—

1. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම ... 1970.1.20 දින දවල් 12 දක්වා
2. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම ... 1970.1.21 දින දවල් 12 දක්වා
3. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම ... 1970.1.23 දින පෙරවරු 10ට.

ටෙන්ඩර් දැන්වීමේ සඳහන් අනිකුත් කොන්දේසි ඒ අයුරින්ම ක්‍රියාත්මක වෙනවා ඇත.

අමර හේවා මද්දුම,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
(කොළඹ දිස්ත්‍රික්කය).

12-1291—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

1970 වර්‍ෂයට අවශ්‍ය පොත්පත් මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1970 ජනවාරි මස 26 වෙනිදා පෙරවරු 10 වනතෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත ෆෝර්මවල ලියා අනුපිටපතකින් ද, යුක්ත කොට එවිය යුතුයි. මෙම ෆෝර්ම පත් කොළඹ 5, නො. 200, කිරුළ පාරේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායඝාලයෙන් 1970 ජනවාරි 25 වෙනිදා දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ෆෝර්ම පත් ලබා ගැනීමට කොළඹ 5, කිරුළ පාරේ, නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරිතැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කළ යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරීතැන.

නො. 200, කිරුළ පාර,
කොළඹ 5,
1969. 12. 18.

2-1270—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්‍ෂයට වවුනියා දිස්ත්‍රික්කයට අයත් වවුනියාවෙහි පිහිටි " ඒ " වර්‍ගවල, මුලතිව් හි පිහිටි " බී " වර්‍ගවල, මන්නාරමේ පිහිටි " සී " වර්‍ගයට අයත් රජයේ ගොඩනැගිලිවලට (ටෙන්ඩර් වෙන වෙනම එවිය යුතුය) නඩත්තු කිරීම හා සුලු වැඩිදියුණු කිරීම සඳහා එවන ටෙන්ඩර් පත් යාපනයේ වෙරළ පාරේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උතුරු කොට්ඨාශයේ, අධිකාරි ඉංජිනේරු කායඝාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජනවාරි මස 28 වැනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, වවුනියාවේ දිස්ත්‍රික්ක ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය. මේ සම්බන්ධයෙන් සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැක.

3. 1970 ජනවාරි මස 16 වැනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 24,000 නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට වර්ග " ඒ " පමණක් සහ රු. 23,000 නොඅඩු අය වර්ග " බී " සහ රු. 30,000 නොඅඩු අය වර්ග " සී " පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 (" ඒ " සහ " බී " සඳහාත්) රු. 50 (" සී " වර්ගය සඳහාත්) තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වෙනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරණ නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් පත් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරණ අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරණ නිලධාරී තැනගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැකිය.

තෝ. මාණික්කම්,
අධිකාරි ඉංජිනේරු, උ. කො., (ගොඩනැගිලි).

අධිකාරි ඉංජිනේරු කායඝාලය, උ. කො.,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
යාපනය, 1969 දෙසැම්බර් මස 12 දින දීය.

12-1120—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත

මෙම කාර්යාලයේ පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

1. උඩබුලත්ගම ඇල්ලඋඩ ගිරිහෙල්ලන අමුණ සෑදීම.
2. උඩබුලත්ගම දෙකිඳ අමුනෝවල අමුණ වැඩි දියුණු කිරීම.
3. උඩබුලත්ගම මැඩිල්ල කොස්බේරිය අමුණ සෑදීම.
4. උඩබුලත්ගම කරහඳුන්ගල පන්සලදෙනිය අමුණ සෑදීම.
5. උඩබුලත්ගම අඹතලාව නුගේමුල අස්වැද්දුම අමුණ වැඩි දියුණු කිරීම.
6. පාතහේවාහැට එරමුදුගොල්ල ඇල අලුත්වැඩියා කිරීම.
7. පාතහේවාහැට ලේවැල්ල හපුවෙල ඇල වැඩිදියුණු කිරීම.
8 උඩපළාත රත්මල්කඩුවේ ගල්අමුණ සෑදීම.
9. උඩපළාත ගලන අමුණ අලුත්වැඩියා කිරීම.
10. උඩපළාත උඩගම පුවක්දන්ඩාවේ ඇල සෑදීම.
11. උඩපළාත මුල්ගම ගොරොක්ගහපිටියේ ඇලවේල්ල තැනීම.
12. උඩපළාත උලපනේ ජම්බුගහමුල අමුණ ඇල තැනීම.
13. උඩපළාත බෙරවිල මහ ඇල ප්‍රතිසංස්කරණය කිරීම.
14. ගලගෙදර ගලබාව, ටකරංවෙලේ අමුණ සෑදීම.
15. ගලගෙදර, ගලගෙදර හද්දපිටිය උණපෙහියාව අමුණ තැනීම.
16. උඩදුම්බර රඹුක්වැල්ල මීගොල්ල ඇල පෝටාව තැනීම.
17. උඩදුම්බර කෙවුල්ගම ඇලේ පෝටාව තැනීම.
18. උඩදුම්බර ඞී. 34 ඇලේ 2 වැනි අතුරු ඇලේ ජලය පිටවන ස්ථානයේ බැම්ම බැඳීම.
19. උඩදුම්බර කීදියගොඩ බරවර්ධන ඔය අමුණ ප්‍රතිසංස්කරණය
20. පාතදුම්බර අලුත්ගම දීගහවතුර ඇල්ලේ අමුණ ප්‍රතිසංස්කරණය.
21. පාතදුම්බර දම්බරාව දොඩම්ගොල්ලේ ඇල වැඩිදියුණු කිරීම.
22. පාතදුම්බර නාරම්පනාවේ පුහුල්පනාවේ ඇල වැඩිදියුණු කිරීම.
23. හාරිස්පත්තුව අලවත්ත වේවැල්කැපියේ ඇල ප්‍රතිසංස්කරණය.
24. හාරිස්පත්තුව කොණ්ඩදෙනිය කුරහන්කොටුවේ අමුණට ලැලි ඇමීම.
25. හාරිස්පත්තුව හැදෙනිය හතේකනුවේ සිට ඇල නඩත්තුව.
26. මැදුම්බර රේටියගම මහඇල ගංවතුර හානි ප්‍රතිසංස්කරණය.
27. මැදුම්බර ගොඩමුන්නේ මහරවෙල ඇල ප්‍රතිසංස්කරණය.
28. මැදුම්බර උඩවෙල ඇල අලුත්වැඩියා කිරීම.
29. මැදුම්බර මඟුල්දෙනිය ලියන්ගහයට අමුණ අලුත්වැඩියා කිරීම.
30. මැදුම්බර පෝද්දල්ගොඩ අලුත් ඇල ප්‍රතිසංස්කරණය.
31. මැදුම්බර අම්බාලේ පිංවත්ත ඇල ප්‍රතිසංස්කරණය.
32. මැදුම්බර වේඩරුව මීමනේ ඇල ප්‍රතිසංස්කරණය.
33. මැදුම්බර ගබ්බල මීගහමුල අමුණ තැනීම.
34. මැදුම්බර ගිඩ්ඩව දවටගහවෙල්යායේ අමුණ තැනීම.
35. මැදුම්බර වැගල තිත්තවැල්කදුරේ අමුණ තැනීම.
36. මොටාමුරේ මැද ඇල තැනීම.
37. උඩුනුවර හේන්දෙනිය යකඩේ අමුණ තැනීම.
38. උඩුනුවර අලපලාවල සපුගස්කුඹුරේ වෙල්යායට ජල පහසුකම්.
39. උඩුනුවර මාත්ගමුව ඇලිවල හකුරුකුඹුර අමුණ තැනීම.
40. පිලිගල්ල අඹකඳවල අමුණ ඇල අලුත්වැඩියා කිරීම.
41. උඩුනුවර දෙහිපාගොඩ දෙල්උනුමුව අමුණ තැනීම.
42. උඩුනුවර ඉඹුල්හිටියාවේ ඉමවේල්ල තැනීම.
43. යටිනුවර කෙටලිගොඩ වැලිපැලේ දොලේ හියුම්බට ඇමීම.
44. යටිනුවර සූරියගොඩ පිලපිටිය දක්වා ඇල වැඩිදියුණු කිරීම.
45 තුම්පනේ කන්නාදෙනිය කළුඇමඩයායේ ඇල නඩත්තුව.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1970 ජනවාරි මස 19 දින දවල් 12 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාර්යාලයෙන් ලබාගත හැක. රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 ජනවාරි මස 23 දින පෙරවරු 9.30 ට පෙර මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරී තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත්වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින්

1970 ජනවාරි මස 23 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. 'ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවනතුරු වලංගුව තැබිය යුතුය.

සී. පී. ඇම්. විජයදෝරු,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

මහනුවර දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 දෙසැම්බර් මස 13 දින දීය.

12–1137—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

**රත්මලානේ ලංගම අපහරණ මධ්‍යස්ථානයෙන් පිස්ටන්, පැවරල් ඇන්ජිම් සඳහා වූ පිස්ටන් වළලු සහ ට්‍රක් රථවලට යොදන අවාන් පටි යන මේවා විකිණීම**

රත්මලානේ ලංගම අපහරණ මධ්‍යස්ථානයෙන් පිස්ටන්, පැට්‍රල් ඇන්ජිම් සඳහා වූ පිස්ටන් වළලු හා ට්‍රක් රථවලට යොදන අවාන් පටි යන මේවා මිලට ගෙන ඉවත් කර ගෙන යාම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් බාරගනු ලැබේ. පිස්ටන් හා පිස්ටන් වළලු සම්මත ප්‍රමාණවල සිට 060 ප්‍රමාණය ඉක්මවා යන පහත දැක්වෙන වගී හා මාදිලිවලින් සමන්විතය.

චවලේ ඇල්ඇම් 6700, ඇම්ඇම්. බෙඩ්පෝර්ඩ් ඔබී ඉන්ටනැෂනල් ආර්—160 ඩොජ්, කොමර් සිලිංඩර් 5 හා සිලිංඩර් 6 පෝර්ඩ් වී/8-85 එච්.පී. හා එච්.පී. 95 පෝර්ඩ් තේම්ස් හා විවිධ වර්ග.

යථෝක්ත උපකරණ තොගවලට වෙන්කොට ඇති අතර ටෙන්ඩර ලියවිල්ලේ සඳහන් වන පරිදි ඒ ඒ තොග සඳහා ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුයි.

සිල් තැබූ ටෙන්ඩර පත්‍ර, ටෙන්ඩර බාරගන්නා අවසාන දිනට පෙර දින දවල් 12 දක්වා මේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල අනුපිටපතකින් යුක්තකොට ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර පෝරම නිකුත් කරන ලබන්නේ මුදලින් රු. 250 ක ටෙන්ඩර තැන්පත් මුදලක් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ ලංගම ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත තැන්පත් කොට අදාල කුවිතාන්සිය මගේ කාර්යාලයට ඉදිරිපත් කළ විටය.

ටෙන්ඩර පත්‍ර බාර ගැනීම 1970 පෙබරවාරි මස 1 වෙනි දින පෙ. ව. 10 ට අවසන් කරනු ලැබේ. රත්මලානේ අපහරණ මධ්‍යස්ථානයේ කාර්ය භාර නිලධාරි මහතා සමග පිළිවෙලක් යොදාගෙන පිස්ටන්, පිස්ටන් වළලු හා ට්‍රක් රථවලට යොදන අවාන් පටි තොග කාර්යාල වේලාව තුළදී රත්මලානේ ලංගම අපහරණ මධ්‍යස්ථානයේදී පරීක්ෂාකර බැලිය හැක.

මේ සම්බන්ධ වැඩි විස්තර මගෙන් දැනගත හැකිය.

ප්‍රධාන සම්පාදන නිලධාරි.

කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේ පිහිටි,
ලංගම සම්පාදන කොට්ඨාසයේ දීය.

12–1153—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ "බී" කොටසේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ වැඩි දියුණුකිරීම් සම්බන්ධව 1969.11.28 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ දෙවැනි කොටසේ පළවූ ටෙන්ඩර් දැන්වීමේ සඳහන් ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දිනය 1970.1.18 වැනි දින පෙ. ව. 10.30 දක්වා දීර්ඝ කළ බැව් හා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1970.1.5 වැනි දින ප. ව. 4.30 දක්වා දීර්ඝ කළ බැව් ද මෙයින් දැනුම්දෙනු ලැබේ.'

ඇන්. පී. රාජන්,
බටහිර කොට්ඨාශයේ ගොඩනැගිලි පිළිබඳ අධිකාරි ඉංජිනේරුතැන.

වර්ෂ 1969 ක්වූ දෙසැම්බර් මස 13 වැනි දින,
කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ
බටහිර කොට්ඨාශයේ ගොඩනැගිලි පිළිබඳ අධිකාරි
ඉංජිනේරු කාර්යාලයේදිය.

12–1099—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## වැලිසර පුපුරණ ද්‍රව්‍ය ගබඩාව සඳහා අළුත් ගබඩා දෙකක් සෑදීම සඳහා වූ ගැනුම්පත් නිවේදනය

1969. 12. 5 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පතෙහි පලවුනු ඉහත සඳහන් ගැනුම්පත් දැන්වීම අවලංගු කරන ලදී.

එන්. පී. රාජන්,
අධිකාරි ඉංජිනේරු බටහිර කොට්ඨාශය (ගොඩනැගිලි).

12–1091—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂය තුල බදුල්ල දිස්ත්‍රික්කයේ 'බී' කොටසේ (දියතලාව ප්‍රදේශ) රජයේ සහ වෛද්‍ය ගොඩනැගිලි නඩත්තු කිරීම සහ සුළු අළුත්වැඩියා කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජනවාරි මස 8 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වනතෙක් බාර ගනු ලැබේ.

2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයා ගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 73,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජී. ඩී. සමරසූරිය,
අධිකාරී/ඉංජිනේරු,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

අධිකාරී, නැගෙනහිර කොට්ඨාශයේ,
ඉංජිනේරු කාර්යාලය,
ගොඩනැගිලි දෙපාතීමේන්තුව, බදුල්ල.

12–1189/1—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ 'සී' කොටසේ (බිබිල ප්‍රදේශයේ) රජයේ සහ වෛද්‍ය ගොඩනැගිලි නඩත්තු කිරීම සහ සුළු අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජනවාරි මස 8 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 31,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජී. ඩී. සමරසූරිය,
අධිකාරී/ඉංජිනේරු,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

අධිකාරී/නැ. කො. ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,

12–1189/2—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1970 වර්ෂය තුළදී බදුල්ල දිස්ත්‍රික්කයේ 'ඒ' කොට්ඨාශයේ බදුල්ල ප්‍රදේශයේ රජයේ සහ වෛද්‍ය ගොඩනැගිලි නඩත්තු කිරීම සහ සුළු අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජනවාරි මස 8 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයෙහිදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 98,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ජී. ඩී. සමරසූරිය,
අධිකාරී/ඉංජිනේරු,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

අධිකාරී/ඉංජිනේරු කාර්යාලය,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, බදුල්ල.

12–1189/3—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

අට්ටාලච්චේනෙයි මධ්‍යම වෙළඳ පොල, මධ්‍යම බෙහෙත් ශාලාවක් සහ, සහකාර වෛද්‍ය වෘත්තික නිවාසයක් බවට පරිවර්තනය කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බදුල්ල පිහිටි නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ක්වූ ජනවාරි මස 8 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ.

2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කල්මුනේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙලකොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැළැස්මද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. කලින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 25,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වශයෙන්, රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 දෙසැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

———,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු.

නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී
ඉංජිනේරු කාර්යාලය,
බදුල්ල.
1969. 12. 12.

12–1215—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

බදුල්ලේ මිණුම් අධිකාරී කාර්යාලයේ වහල ඇස්බැස්ටස් සීට් යොදා නැවත සෙවිලි කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, බදුල්ලේ පිහිටි නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරුවරයාගේ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් 1970 ක්වූ ජනවාරි මස 8 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 වන තෙක් භාරගනු ලබේ.

2. ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බදුල්ලේ දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්වල ටෙන්ඩර් පත් පිළියෙලකොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැළැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. කලින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 18,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වශයෙන්, රු. 25 ක්, තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය 1969 ක්වූ දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුනේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

————,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු

නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී
ඉංජිනේරු කාර්යාලය,
බදුල්ල.
1969. 12. 12.

12–1216—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් ප්‍රතිඵල

| ටෙන්ඩර් කැඳවූ ප්‍රමාණය | වර්ගය | අවසන් දිනය | ලැබුණු ටෙන්ඩර් ප්‍රමාණය | ඇණවුම් කළ ප්‍රමාණය | සැපයුම්කරු | නිෂ්පාදිත රට | මිළ |
|---|---|---|---|---|---|---|---|
| දි ටොන් 1500 ... | රීල් වශයෙන්යුත් ක්‍රාප්ට් කඩදාසි මි.මී. 1030 | 69.6.16... | 26 (පමාවී ලද ටෙන්ඩර් 2 කි) | දිගටොන් 250 | එලොප් හැන්සන් ඇස්–413. 03, ගොටෙබර්ග්, ස්වීඩනය | ස්වීඩනය ... | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ ප. 83 පැ. 3 සි.7 |
| | | | | දිගටොන් 250 | පර්සිවොන් ෂොල්ට්ස් සමාගම, 401–24, ගොටෙන්බර්ග්, ස්වීඩනය | ස්වීඩනය ... | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ ප.83 පැ.3 සි.7 |
| | | | | දිගටොන් 250 | ස්කැන්ඩිනේවියන් ඕවර්සීස් පේපර් කොම්පැනි තැ.පෙ. 263, ගොටෙන්බර්ග්, ස්වීඩනය | ස්වීඩනය ... | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ ප.83, පැ.3 සි.7 |
| | | | | දිගටොන් 250 | සීමාසහිත ජැන් ලෙයි බිග් තැ. පෙ. 254, ගොටෙන්බර්ග්, ස්වීඩනය | ස්වීඩනය ... | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ ප.83 පැ.3 සි.7 |
| | | | | දිගටොන් 500 | සීමාසහිත ප්‍රින්ස් ජෝජ් පල්ප් ඇන්ඩ් පේපර් සමාගම, තැ. පෙ. 6000, බ්‍රිතාන්‍ය කොලොම්බියාව, කැනඩාව | කැනඩාව ... | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ අමෙරිකානු ඩොලර් 193/50 |
| දිග ටොන් 20 ... | ස්ටාච් ... | 69.7.24... | 25 (පමාවූ ටෙන්ඩර් 2) | දිගටොන් 20 | සීමාසහිත ඇන්ඩෘබේකර් ප්‍රයිවෙට් තැ. පෙ. 22, හොමෙබුෂ්, නිව් සවුත් වෙස්ට් 2140, ඕස්ට්‍රේලියාව | ඕස්ට්‍රේලියාව | කොළඹට දිග ටොන් 1ක් සඳහා ආ.මී.ව. මිළ රු. 1,034 |

නි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී.
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

කොළඹ 2,
යූනියන් පෙදෙස, 356,
1969 නොවැම්බර් 27 දින.

12–1288—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## වාණිජ හා වෙළඳ අමාත්‍යාංශය

### පරිහරණයට නුසුදුසු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

පහත සඳහන් පරිහරණයට නුසුදුසු භාණ්ඩ කොළඹ 3, ගෝල්ෆේස් කෝට්හි අංක 52 දරණ මැදිරියේ පිහිටි මෙම අමාත්‍යාංශ කාර්යාලයේදී 1970 ජනවාරි 10 වැනි දින පස්වරු 4.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | | |
|---|---|---|
| තීන්ත කුඩු තනි | ... | 10 |
| යතුරු ලේඛක මේස | ... | 1 |
| යතුරු ලියන ඉංග්‍රීසි | ... | 2 |

ගෙවීම සියල්ල මුදලින් කළ යුතු අතර වෙන්දේසිය නිම වූ වහාම භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

ආර්. ලීලාරත්න,
ස්ථිර ලේකම් වෙනුවට.

වාණිජ හා වෙළඳ අමාත්‍යාංශය,
ගෝල්ෆේස් කෝට්,
කොළඹ 3.

12–1170—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**පාවිච්චියට ගත නොහැකි වාහනයක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

යාපනය බන්ධනාගාරයට අයත් මෙහි පහත සඳහන් කරන වාහනය 1970.1.17 වෙනි දින පෙරවරු 10 ට යාපනය බන්ධනාගාර භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. 33 ශ්‍රී 2027 මොරිස් කොමර්ෂල් පුද්ගලික බස් රථය.

වෙන්දේසිය අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර දින 3 ක් ඇතුළත වාහනය එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය. ඉල්ලුම් කිරීමට කැමැති අයට යාපනය බන්ධනාගාර අධිකාරී තැනගේ අනුදැනුම ඇතිව වාහනය පරීක්ෂා කිරීමට කටයුතු පිළියෙල කර ගත හැක.

ඉල්ලීම් එකක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය මෙහි පහත අත්සන් කරන මා සතුය.

සී. ටී. ජෑන්ස්,
බන්ධනාගාර අධිකාරී, යාපනය.

1969.12.17 වෙනි දින,
යාපනය බන්ධනාගාරයේදීය.

12–1108—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

**ඩෙල්ෆ්ට්-කුරිකඩ්ඩුවාන් තොටුපල් සේවය — 1970 ජනවාරි 1 සිට 1970 දෙසැම්බර් 31 දක්වා**

**ටෙන්ඩර් දැන්වීම අවලංගු කිරීම**

1969 දෙසැම්බර් 12 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ වූ ඩෙල්ෆ්ට් කුරිකඩ්ඩුවාන් තොටුපල් සේවය සඳහා රේන්ද විකිණීමේ නිවේදනය අවලංගු කළ බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එෆ්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

දිසාපති කාර්යාලය,
යාපනය,
1969 දෙසැම්බර් 19 වන දින දීය.

12–1100—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**වෙන්දේසියේ විකිණීමයි**

**බෙදුම් නඩු තීන්දුවක් යටතේය**

කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක P. 2020 දරණ නඩුවෙන් මා වෙත නිකුත් කරන ලද කොමිෂන් බලයපිට සහ 1951 අංක 16 දරණ ඉඩම් බෙදුම් ආඥා පනතේ නියමයන්ට අනුකූලව පහත විස්තර කරන් ලද ඉඩම මවිසින් 1970 ජනවාරි මස 13 වෙනි දින උදේ 10 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල නගර සභා සීමාව තුළ කස්ඩම් පාරේ වරිපනම් අංක 90 සහ 90ඒ දරණ ප්‍රමාණයෙන් පර්චස් 6.48 කින් යුත් ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සමඟ.

ඉඩම තක්සේරු කළ මිලට පළමුවෙන් අයිතිකරුවන් අතර වෙන්දේසිකර ඔවුන්ගෙන් කිසිවෙකු විසින් නොගනු ලැබුවහොත් ඉන්පසු වහාම එය මහජනයා අතර වෙන්දේසිකර ඉල්ලුම් කරන වැඩිම මිලට දෙනු ලැබේ.

වැඩි විස්තර සඳහා කළුතර බාකීර් මාකර් සහ ප්‍රනාන්දු නීතිඥ මහතුන්ගෙන් හෝ මගෙන් විමසන්න.

ඔස්ටින් ද ඇස්. ගුණමුනි,
උසාවියේ විකිණීම් කොමසාරිස්.

අංක 41, දුම්රියපොළ පාර,
කළුතර දකුණ.

12–1256—69.12.26 දින අංක 14,886 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1969**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**1970**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 | සිකුරාද | ... | 69.12.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 | සිකුරාද | ... | 70. 1. 2 | සිකුරාද | ප ව | 3 30 |
| | | 70. 1.16 | සිකුරාද | ... | 70. 1. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 | සිකුරාද | ... | 70. 1.16 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 1.29 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 | බදාද | පෙ.ව. | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 | බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 | සිකුරාද | ... | 70. 2. 5 | බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.00 |
| | | 70. 2.20 | සිකුරාද | ... | 70. 2.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 | සිකුරාද | ... | 70. 2.20 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 | සිකුරාද | පෙ.ව. | 12.00 |
| | | 70. 3.13 | සිකුරාද | ... | 70. 3. 5 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 | සිකුරාද | ... | 70. 3.13 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 | බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 | සිකුරාද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි